## අ.පො.ස (උ.පෙළ) විභාගය - 2017

# ඇගයීම් වාර්තාව

# 32 - ව්‍යාපාර අධ්‍යනය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

# අ.පො.ස.(උ.පෙළ) විභාගය -2017

## ඇගයීම් වාර්තාව

# 32 - ව්‍යාපාර අධ්‍යයනය

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2017 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 206630 ක් පාසල් අයදුම්කරුවෝ ද 46700 ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, ඔවුන් ලකුණු ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය හා එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2017 විභාගයේ ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව ආයක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයාංගම ස්තූතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2020.05.14
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | එස්. ප්‍රනවදාසන්<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **විෂය සම්බන්ධීකරණය** | : | පී. ඒ වෙනුර චන්දික<br>සහකාර විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සංස්කරණය** | : | මහාචාර්ය ගාමිනී ද අල්විස්<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>කොළඹ විශ්ව විද්‍යාලය<br><br>ආචාර්ය එම්. ඩී. පුෂ්පකුමාරි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| **සැකසුම් කමිටුව** | : | ඩබ්ලිව්. එම්. සුදුබණ්ඩා<br>වාණිජ - ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය,<br>පස්සර<br><br>ඩබ්ලිව්. ඩී. රංජිත් ජයනාද<br>ගුරු සේවය I<br>ශාන්ත පීතර විද්‍යාලය,<br>කොළඹ 04.<br><br>ඒ. ජී. සුවිනීතා<br>ගුරු සේවය I<br>මාර/තලල්ල උතුර ධර්ම විජය මහා විද්‍යාලය,<br>මාතර<br><br>එම්. ජී. දිස්නා කුමාරි<br>ගුරු සේවය I<br>ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලය,<br>පානදුර<br><br>ෂෙරීන් කන්ඩම්බි<br>ශ්‍රී ලංකා ගුරු සේවය II<br>අනුලා විද්‍යාලය<br>නුගේගොඩ. |
| **පරිගණක පිටපත සැකසුම** | : | ඩී. ජී. චමේෂි මධුෂිකා වීරසිරි<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |
| **පිටකවරය නිර්මාණය** | : | ආර්.එම්. නිලුපුල් ශෙහාන් යසරත්න<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |

## ඇතුළත පිටු


පිටු අංකය

**I කොටස**

**1** විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු
**1.1** ව්‍යාපාර අධ්‍යයන විෂයෙහි අභිමතාර්ථ 1
**1.2** විෂය සාධනය පිළිබඳ තොරතුරු
1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

**1.3** විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය
1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

**II කොටස**

**2** ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
**2.1** I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 9
2.1.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා) 10
2.1.3 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට 30 තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 15
2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 1-30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ 16
2.1.5 I ප්‍රශ්න පත්‍රයේ අංක 1-30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය - (ප්‍රතිශත ලෙස) 17
2.1.6 I ප්‍රශ්න පත්‍රයේ අංක 1-30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා 18
2.1.7 I ප්‍රශ්න පත්‍රයේ අංක 31- 50 තෙක් ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 20
2.1.8 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ 27
2.1.9 I ප්‍රශ්න පත්‍රයේ අංක 31-50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබා ඇති ආකාරය 28
2.1.10 I ප්‍රශ්න පත්‍රයේ අංක 31-50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා 29
**2.2** II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 30
2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 31
2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 58

**III කොටස**

**3** පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා
3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 59
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 60

## I කොටස

# 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1 ව්‍යාපාර අධ්‍යයනය විෂයයෙහි අභිමතාර්ථ

මෙම පාඨමාලාව හැදෑරීමෙන් ශිෂ්‍යයා,

- මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම හා සම්බන්ධ ගැටලුවලට, ආයතන හෝ සංවිධාන පදනම් කරගෙන විසඳුම් සෙවිය හැකි ආකාර පිළිබඳව නිපුණතා වර්ධනය කර ගනියි.
- ගතික ව්‍යාපාර පරිසරය අවබෝධ කර ගැනීම මගින් එයට අනුවර්තනය වීමට අවශ්‍ය කුසලතා ලබා ගනියි.
- ව්‍යාපාර හා ඊට සම්බන්ධ උපකාරක සේවා පිළිබඳව ලබාගන්නා න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව භාවිත කරයි.
- ව්‍යාපාර හා සම්බන්ධ සංකල්ප හා මූලධර්ම අධ්‍යයනය කිරීමටත්, සංකීර්ණ විෂය කරුණු සරලව ග්‍රහණය කර ගැනීමටත් නිපුණතා වර්ධනය කර ගනියි.
- ව්‍යවසායකත්ව හා කළමනාකරණ කුසලතා වර්ධනය කර ගනියි.
- ව්‍යාපාර පද්ධතියක ශ්‍රිත අතර සමෝධානිත බව පෙන්වා දෙයි.
- දේශීය, කලාපීය හා ගෝලීය වශයෙන් ව්‍යාපාරවල නිරත වීමට අවශ්‍ය මූලික නිපුණතා ලබා ගනියි.
- ශ්‍රී ලංකාව තුළ යහපත් ව්‍යාපාර සංස්කෘතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය ආකල්ප ගොඩනගා ගනියි.
- සැලසුම් සහගතව ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අවශ්‍ය කුසලතා ලබාගනියි.
- වෘත්තීය භූමිකාවල සාර්ථකව කටයුතු කිරීමට අවශ්‍ය නිපුණතා ලබා ගනියි.
- සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා කළමනාකරණය හා නූතන තාක්ෂණය භාවිත කිරීමේ කුසලතා වර්ධනය කරගනියි.
- උසස් අධ්‍යාපනයට යොමු වීම උදෙසා ප්‍රවේශයක් ලබා ගනියි.

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 41719 | 3842 | 45561 |
| දෙමළ | 7422 | 930 | 8352 |
| ඉංග්‍රීසි | 1818 | 888 | 2706 |
| **එකතුව** | **50959** | **5660** | **56619** |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 5580 | 10.95 | 313 | 5.53 | 5893 | 10.41 |
| B | 9222 | 18.10 | 687 | 12.14 | 9903 | 17.50 |
| C | 15853 | 31.11 | 1352 | 23.89 | 17205 | 30.39 |
| S | 14595 | 28.64 | 1875 | 33.13 | 16470 | 29.09 |
| F | 5709 | 11.20 | 1433 | 25.32 | 7142 | 12.61 |
| එකතුව | **50959** | **100** | **5660** | **100** | **56619** | **100** |

වගුව 2

1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 8001 | 1001 | 12.51 | 1453 | 18.16 | 2459 | 30.73 | 2232 | 27.90 | 7145 | 89.30 | 856 | 10.70 |
| 2. ගම්පහ | 4819 | 558 | 11.58 | 921 | 19.11 | 1387 | 28.78 | 1432 | 29.72 | 4298 | 89.19 | 521 | 10.81 |
| 3. කළුතර | 2374 | 229 | 9.65 | 390 | 16.43 | 745 | 31.38 | 704 | 29.65 | 2068 | 87.11 | 306 | 12.89 |
| 4. මහනුවර | 2862 | 284 | 9.92 | 457 | 15.97 | 824 | 28.79 | 907 | 31.69 | 2472 | 86.37 | 390 | 13.63 |
| 5. මාතලේ | 841 | 55 | 6.54 | 127 | 15.10 | 274 | 32.58 | 244 | 29.01 | 700 | 83.23 | 141 | 16.77 |
| 6. නුවරඑළිය | 1075 | 69 | 6.42 | 172 | 16.00 | 390 | 36.28 | 327 | 30.42 | 958 | 89.12 | 117 | 10.88 |
| 7. ගාල්ල | 2320 | 258 | 11.12 | 323 | 13.92 | 660 | 28.45 | 663 | 28.58 | 1904 | 82.07 | 416 | 17.93 |
| 8. මාතර | 1461 | 208 | 14.24 | 278 | 19.03 | 458 | 31.35 | 373 | 25.53 | 1317 | 90.14 | 144 | 9.86 |
| 9. හම්බන්තොට | 837 | 89 | 10.63 | 130 | 15.53 | 224 | 26.76 | 255 | 30.47 | 698 | 83.39 | 139 | 16.61 |
| 10. යාපනය | 950 | 123 | 12.95 | 152 | 16.00 | 295 | 31.05 | 278 | 29.26 | 848 | 89.26 | 102 | 10.74 |
| 11. කිලිනොච්චි | 159 | 11 | 6.92 | 13 | 8.18 | 49 | 30.82 | 55 | 34.59 | 128 | 80.50 | 31 | 19.50 |
| 12. මන්නාරම | 163 | 16 | 9.82 | 30 | 18.40 | 52 | 31.90 | 49 | 30.06 | 147 | 90.18 | 16 | 9.82 |
| 13. වව්නියාව | 327 | 25 | 7.65 | 62 | 18.96 | 97 | 29.66 | 98 | 29.97 | 282 | 86.24 | 45 | 13.76 |
| 14. මුලතිව් | 136 | 10 | 7.35 | 24 | 17.65 | 47 | 34.56 | 38 | 27.94 | 119 | 87.50 | 17 | 12.50 |
| 15. මඩකලපුව | 678 | 32 | 4.72 | 93 | 13.72 | 226 | 33.33 | 218 | 32.15 | 569 | 83.92 | 109 | 16.08 |
| 16. අම්පාර | 954 | 107 | 11.22 | 144 | 15.09 | 218 | 22.85 | 298 | 31.24 | 767 | 80.40 | 187 | 19.60 |
| 17. ත්‍රිකුණාමලය | 561 | 54 | 9.63 | 89 | 15.86 | 151 | 26.92 | 175 | 31.19 | 469 | 83.60 | 92 | 16.40 |
| 18. කුරුණෑගල | 2303 | 343 | 14.89 | 413 | 17.93 | 680 | 29.53 | 649 | 28.18 | 2085 | 90.53 | 218 | 9.47 |
| 19. පුත්තලම | 1223 | 141 | 11.53 | 266 | 21.75 | 427 | 34.91 | 283 | 23.14 | 1117 | 91.33 | 106 | 8.67 |
| 20. අනුරාධපුරය | 1278 | 194 | 15.18 | 210 | 16.43 | 357 | 27.93 | 340 | 26.60 | 1101 | 86.15 | 177 | 13.85 |
| 21. පොළොන්නරුව | 619 | 63 | 10.18 | 93 | 15.02 | 164 | 26.49 | 182 | 29.40 | 502 | 81.10 | 117 | 18.90 |
| 22. බදුල්ල | 1486 | 122 | 8.21 | 207 | 13.93 | 425 | 28.60 | 486 | 32.71 | 1240 | 83.45 | 246 | 16.55 |
| 23. මොනරාගල | 640 | 51 | 7.97 | 114 | 17.81 | 228 | 35.63 | 184 | 28.75 | 577 | 90.16 | 63 | 9.84 |
| 24. රත්නපුරය | 1632 | 106 | 6.50 | 286 | 17.52 | 552 | 33.82 | 491 | 30.09 | 1435 | 87.93 | 197 | 12.07 |
| 25. කෑගල්ල | 1366 | 187 | 13.69 | 260 | 19.03 | 410 | 30.01 | 362 | 26.50 | 1219 | 89.24 | 147 | 10.76 |
| **සමස්ථ දිවයින** | **39065** | **4336** | **11.10** | **6707** | **17.17** | **11799** | **30.20** | **11323** | **28.99** | **34165** | **87.46** | **4900** | **12.54** |

වගුව 3

### 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91-100 | 32 | 0.06 | 56619 | 100.00 |
| 81-90 | 1274 | 2.25 | 56587 | 99.94 |
| 71-80 | 6699 | 11.83 | 55313 | 97.69 |
| 61-70 | 11064 | 19.54 | 48614 | 85.86 |
| 51-60 | 12582 | 22.22 | 37550 | 66.32 |
| 41-50 | 11973 | 21.15 | 24968 | 44.10 |
| 31-40 | 8473 | 14.96 | 12995 | 22.95 |
| 21-30 | 3651 | 6.45 | 4522 | 7.99 |
| 11-20 | 809 | 1.43 | 871 | 1.54 |
| 01-10 | 61 | 0.11 | 62 | 0.11 |
| 00-00 | 1 | 0.00 | 1 | 0.00 |

වගුව **4**

ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා පෙනී සිටි 56619 දෙනා අතුරෙන්, 31- 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ඇති සංඛ්‍යාව 8473 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 15% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 12995 ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 23% කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 01, 02 හා 04 වන ප්‍රශ්නවලටය. ඒවායේ ප්‍රතිශත පිළිවෙලින් 98%, 98%, 99% වේ. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 49 වන ප්‍රශ්නයටය. එහි ප්‍රතිශතය 21% කි.

### 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




උදාහරණයක් වශයෙන් ගතහොත්, පිළිතුරු සැපයීම සඳහා ප්‍රශ්න තෝරා ගැනීමේදී 01 වන ප්‍රශ්නය 100% ක් පමණ පිරිසක් තෝරාගෙන ඇති අතර 07 වන ප්‍රශ්නය තෝරාගත් පිරිස 48%ක් පමණ වේ. ප්‍රශ්න තෝරා ගැනීමේදී 1, 2, 3, 5, 8 යන ප්‍රශ්න 60%කට වැඩි පිරිසක් තෝරාගෙන ඇත.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




උදාහරණයක් වශයෙන් මෙහි පළමු ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 16 - 20 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් 14%ක් පමණ වේ. 11 - 15 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් 40%ක් පමණ වේ. 6 - 10 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් 33% ක් පමණ වේ. 0-5 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් 13% ක් පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4.1 (RD/16/04 /AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.

**අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2017**

**32 - ව්‍යාපාර අධ්‍යයනය - II පත්‍රය - II කොටස**

**ප්‍රශ්නවල පහසුතා දර්ශකය**




ප්‍රස්තාරය 4.2

## II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 02 කි. මුළු ලකුණු 100කි.**

* **1 - 30** දක්වා බහුවරණ ප්‍රශ්න **30**කින් ද **31 - 40** දක්වා සුදුසු වචන යොදා හිස්තැන් පිරවීමේ ප්‍රශ්න **10**කින්ද, **41 - 50** දක්වා නිශ්චිත කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **10**කින්ද සමන්විතය.

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අපේක්ෂිතය.

* එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

**2.1.2** I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න අංක 1 සිට 30 දක්වා)

**1.** පහත දැක්වෙන්නේ මිනිස් අවශ්‍යතා හා වුවමනාවල ලක්ෂණ කිහිපයකි.

A - අසීමිත වීම
B - නිර්මාණය කළ හැකි වීම
C - විවිධ වීම
D - පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වීම
E - සීමිත වීම
F - පොදු වීම

ඉහත දැ අකුරෙන් මිනිස් වුවමනාවලට අදාළ ලක්ෂණ පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.

(1) A, B, D (2) A, B, C (3) A, C, E (4) B, D, E (5) B, D, F (......)

**2.** පහත වගුවේ **X** තීරුව මගින් මාධ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ ඇල්මැති පාර්ශ්වකරුවන් කිහිපදෙනෙක් ද, **Y** තීරුව මගින් ඔවුන් ඒ සඳහා උනන්දු වීමට හේතු කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. වාර්තාකරුවන් | 1. මාධ්‍ය වෘත්තිකයින්ගේ අයිතීන් තහවුරු කිරීමට |
| B. මහජනතාව | 2. තොරතුරු රැස් කිරීමට |
| C. රජය | 3. තොරතුරු කළමනාකරණයට |
| D. මාධ්‍ය වෘත්තිකයින්ගේ වෘත්තිය සංගම් | 4. තොරතුරු මගින් දැනුවත් වීමට |
| E. මාධ්‍ය ආයතන පරිපාලකයින් | 5. තොරතුරු පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනයට |

ඇල්මැති පාර්ශ්වකරුවන් හා ඔවුන් උනන්දුවක් දැක්වීමට හේතු නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 2, C - 5, D - 3, E - 4
(2) A - 1, B - 3, C - 4, D - 5, E - 2
(3) A - 2, B - 4, C - 5, D - 1, E - 3
(4) A - 3, B - 1, C - 2, D - 4, E - 5
(5) A - 5, B - 2, C - 3, D - 4, E - 1 (......)

**3.** පහත දැක්වෙන්නේ ව්‍යාපාරයකට අදාළ පාරිසරික සාධකවල ප්‍රවනතා කිහිපයකි.

A - ආර්ථිකයේ මිල මට්ටම් ඉහළ යාම
B - සේව්‍ය-සේවක ගැටුම් වර්ධනය වීම
C - තරගකාරීත්වය වැඩි වීම
D - සේවක පිරිවැටුම අඩු වීම
E - රඳවාගත් ඉපැයීම් අඩු වීම
F - පාරිභෝගික සමිතිවල බලය වැඩි වීම
G - අමුද්‍රව්‍ය අපතේ යාම අඩු වීම
H - වයස්ගත ජනගහනය වැඩි වීම

ඉහත දැ අකුරෙන් අභ්‍යන්තර පාරිසරික සාධකවල ප්‍රවනතා පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, C, D (2) A, D, E, G (3) B, C, E, H (4) B, D, E, G (5) C, F, G, H (......)

**4.** පහත වගුවේ **X** තීරුවේ විවිධ ව්‍යාපාර ආයතන වර්ග හා **Y** තීරුවේ ඒවා ලියාපදිංචි කළ යුතු ආයතන ලැයිස්තුවක් ද දැක් වේ.

| X | Y |
|---|---|
| A. කොටස් නියෝජිත සමාගම් | 1. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව |
| B. රක්ෂණ සමාගම් | 2. ශ්‍රී ලංකා මහ බැංකුව |
| C. බලපත්‍රලාභී බැංකු | 3. ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිසම |
| D. සමූපකාර ග්‍රාමීය බැංකු | 4. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය |

ව්‍යාපාර ආයතන වර්ග හා ඒවා ලියාපදිංචි කළ යුතු ආයතන නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 3, C - 2, D - 4
(2) A - 4, B - 1, C - 3, D - 2
(3) A - 1, B - 2, C - 4, D - 3
(4) A - 3, B - 4, C - 2, D - 1
(5) A - 3, B - 1, C - 2, D - 4 (......)

**5.** ගනුදෙනුකරුවකු නිශ්චිත සන්නම් නාමයකින් ටින් කළ ආහාර වර්ගයක් ව්‍යාපාරිකයකුගෙන් ඉල්ලූ විට ඔහු විසින් ඒ වෙනුවට වෙනත් සන්නම් නාමයක ටින් කළ ආහාර වර්ගයක් ලබා දුන්නේ ය. එම භාණ්ඩයේ අන්තර්ගතය පිළිබඳව ලේබලයෙහි සඳහන් නොවීම නිසා ගනුදෙනුකරු ඒ පිළිබඳව ව්‍යාපාරිකයාගෙන් විමසූ විට ඔහු එය නොසලකා කටයුතු කළේ ය. මෙම සිද්ධියට අනුව කඩ වී ඇති පාරිභෝගික අයිතීන් ගණන

(1) 2 කි. (2) 3 කි. (3) 4 කි. (4) 5 කි. (5) 6 කි. (......)

**6.** ව්‍යාපාර සංවිධානවලට සම්බන්ධ ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - ණයකර නිකුත් කිරීමට හැකි වීම
B - වගකීම අසීමිත වීම
C - නෛතික පුද්ගලභාවයක් නොමැති වීම
D - ව්‍යාපාරය ලියාපදිංචිය අනිවාර්ය වීම
E - ස්වාධීනව තීරණ ගැනීමට හැකි වීම
F - මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කිරීම අනිවාර්ය වීම

ඉහත දැ අතුරෙන් තේවල ස්වාමි ව්‍යාපාරවලට අදාළ ලක්ෂණ අඩංගු කාණ්ඩය තෝරන්න.

(1) A, B, C (2) A, C, E (3) B, C, E (4) B, D, F (5) C, D, F (......)

**7.** හවුල් ව්‍යාපාර සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - හවුල්කරුවන් අතර ලිඛිත ගිවිසුමක් පැවතීම අත්‍යවශ්‍ය වේ.
B - ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ලියාපදිංචිය අත්‍යවශ්‍ය වේ.
C - නෛතික පුද්ගලභාවයක් නොමැත.
D - උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව හවුල් ගිවිසුමකට තීරණය කළ හැක.
E - හවුල්කරුවන්ගේ වගකීම අසීමිත ය.

ඉහත දැ අතුරෙන් හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ

(1) C පමණි. (2) C සහ E පමණි.
(3) C, D සහ E පමණි. (4) A, B, C සහ E පමණි.
(5) A, B, C, D සහ E සියල්ල ම. (......)

**8.** සීමාසහිත පොදු සමාගමක ලක්ෂණයක් **නො වන්නේ**

(1) උපරිම කොටස්කරුවන් සංඛ්‍යාව පිළිබඳ සීමාවක් නොමැති වීමයි.
(2) අධ්‍යක්ෂවරුන්ගේ උපරිම සංඛ්‍යාවක් නොමැති වීමයි.
(3) කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීම අනිවාර්ය වීමයි.
(4) ලාභාංශ ප්‍රකාශ කිරීමට පෙර ණය ගෙවීමේ හැකියාව (නුබුන්වත් බව) පරීක්ෂා කළ යුතු වීමයි.
(5) කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට හැකි වීමයි. (......)

**9.** පහත දැ අතුරෙන් වඩාත් ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ව්‍යවසායකයා ව්‍යාපාරිකයෙකි. (2) ව්‍යවසායකයා කළමනාකරුවෙකි.
(3) ව්‍යවසායකයා වෘත්තිකයෙකි. (4) ව්‍යවසායකයා විශ්ලේෂකයෙකි.
(5) ව්‍යවසායකයා අවස්ථා සොයන්නෙකි. (......)

**10.** පහත සඳහන් දැ අතුරෙන් තැන්පතු භාර ගැනීමට **නො හැකි** මූල්‍ය ආයතන වර්ගය වන්නේ

(1) ඒකක භාර ය. (2) බලපත්‍රලාභී මූල්‍ය සමාගම් ය.
(3) බලපත්‍රලාභී විශේෂිත බැංකු ය. (4) ප්‍රාදේශීය සංවර්ධන බැංකු ය.
(5) බලපත්‍රලාභී වාණිජ බැංකු ය. (......)

**11.** පහත සඳහන් දැ අතුරෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සෘජු සුපරීක්ෂණයට යටත් වන ආයතන වර්ග සංඛ්‍යාව කීය ද?

A - බලපත්‍රලාභී වාණිජ බැංකු
B - බලපත්‍රලාභී විශේෂිත බැංකු
C - බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
D - සමූපකාර ග්‍රාමීය බැංකු
E - සකසුරුවම් හා ණය දෙන සමූපකාර සමිති

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

**12.** පහත දැක්වෙන්නේ විද්‍යුත් ණය කාඩ්පතක සඳහන් මූලිකාංග කිහිපයකි.

A - ණයපත් සංගමයේ ලාංඡනය
B - කාඩ්පතේ අංකය
C - චුම්භක පටිය
D - කාඩ්පත් හිමියාගේ නම
E - සේවා දුරකථන අංකය
F - කල් ඉකුත් වන දිනය
G - අත්සන් පටිය

ඉහත දැ අතුරෙන් විද්‍යුත් ණය කාඩ්පතක මුහුණතෙහි සඳහන් මූලිකාංග පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, E, F (2) A, B, D, F (3) B, C, E, G (4) C, E, F, G (5) D, E, F, G (......)

**13.** පහත දැක්වෙන්නේ රථවාහන සම්බන්ධ අවදානම් කිහිපයකි.

A - දිරාපත් වීම
B - හදිසි අනතුරු
C - සොරකම් කිරීම
D - වෙළෙඳපොළ අගය අඩු වීම
E - විකිණීමෙන් සිදුවිය හැකි අලාභය
F - තෙවැනි පාර්ශ්වයකට සිදු වන හානිය

ඉහත දැ අතුරෙන් මෝටර් රථ රක්ෂණය යටතේ රක්ෂණය කළ හැකි අවදානම් අඩංගු කාණ්ඩය කුමක් ද?

(1) A, B, C (2) A, C, D (3) A, E, F (4) B, C, D (5) B, C, F (……)

**14.** පහත ප්‍රකාශ අතුරෙන් රක්ෂණයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ඕනෑ ම අවදානමක් රක්ෂණය කළ හැකි ය.
(2) කුලී නිවැසියාට තමන් වාසය කරන නිවස රක්ෂණය කිරීමට හිමිකමක් ඇත.
(3) දේපළක් රක්ෂණ සමාගම් කිහිපයක රක්ෂණය කර ඇති විටෙක, එයට සිදු වන හානියක් සඳහා වන්දි සෑම සමාගමකින් ම වෙන් වෙන්ව ලබා ගත හැකි ය.
(4) සේවායෝජකයාට තම සේවකයින් රක්ෂණය කළ හැකි ය.
(5) හානිපූරණ මූලධර්මය ජීවිත රක්ෂණයට අදාළ වේ. (……)

**15.** පහත ප්‍රකාශ අතුරෙන් ප්‍රවාහන පද්ධතියට සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) බස් නැවතුම්පොළ ප්‍රවාහන පර්යන්තයේ අංගයකි.
(2) දුම්රිය මාර්ගය ප්‍රවාහන මාධ්‍යයේ අංගයකි.
(3) ගුවන්යානය ප්‍රවාහන බලයේ අංගයකි.
(4) නැව ප්‍රවාහන මාර්ගයේ අංගයකි.
(5) වරාය ප්‍රවාහන මාධ්‍යයේ අංගයකි. (……)

**16.** පහත දැක්වෙන්නේ කළමනාකරණ ශ්‍රිතවලට සම්බන්ධ කාර්යයන් කිහිපයකි.

A - ශ්‍රම විභජනය
B - පාරිසරික විශ්ලේෂණය
C - සමායෝජනය
D - අරමුණු ස්ථාපිත කිරීම
E - කාර්යයන් හඳුනාගැනීම
F - දෙපාර්තමේන්තුකරණය
G - සන්නිවේදනය

ඉහත දැ අතුරෙන් සංවිධානකරණ ශ්‍රිතයට අදාළ කාර්යයන් පමණක් අඩංගු කාණ්ඩය කුමක් ද?

(1) A, B, C, F (2) A, B, D, G (3) A, C, D, G (4) A, C, D, E (5) A, C, E, F (……)

**17.** පහත වගුවේ **X** තීරුව මගින් මෙහෙයුම් ක්‍රියාකාරකම් කිහිපයක් ද, **Y** තීරුව මගින් මෙහෙයුම් කළමනාකරණ ශ්‍රිතයන් කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. නිෂ්පාදනයට අවශ්‍ය ශ්‍රමය නිර්ණය කිරීම | 1. සැපයුම් දාම කළමනාකරණය |
| B. තොග පාලනය | 2. නිෂ්පාදන ඉංජිනේරුකරණය |
| C. නිෂ්පාදන කාලසටහන් සකස් කිරීම | 3. නිෂ්පාදන පාලනය |
| D. සැපයුම්කරුවන් සංවර්ධනය කිරීම | 4. නිෂ්පාදන සැලසුම් කිරීම |

මෙහෙයුම් ක්‍රියාකාරකම් හා මෙහෙයුම් කළමනාකරණ ශ්‍රිත නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 2, C - 3, D - 4
(2) A - 2, B - 1, C - 4, D - 3
(3) A - 2, B - 3, C - 1, D - 4
(4) A - 3, B - 4, C - 2, D - 1
(5) A - 4, B - 3, C - 2, D - 1 (……)

**18.** පහත වගුවේ **X** තීරුව මගින් අලෙවිකරුගේ දෘෂ්ටිකෝණයෙන් අලෙවිකරණ මිශ්‍රය හා **Y** තීරුව මගින් පාරිභෝගික දෘෂ්ටිකෝණයෙන් අලෙවිකරණ මිශ්‍රය දැක්වේ.

| X | Y |
|---|---|
| A. නිෂ්පාදිතය | 1. පහසුව |
| B. මිල | 2. සන්නිවේදනය |
| C. ප්‍රවර්ධනය | 3. පාරිභෝගික විසඳුම (අවශ්‍යතා හා වුවමනා) |
| D. ස්ථානය (බෙදා හැරීම) | 4. පිරිවැය |

අලෙවිකරුගේ දෘෂ්ටිකෝණයෙන් හා පාරිභෝගික දෘෂ්ටිකෝණයෙන් අලෙවිකරණ මිශ්‍රය නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A - 1, B - 2, C - 3, D - 4
(2) A - 2, B - 1, C - 3, D - 4
(3) A - 2, B - 3, C - 4, D - 1
(4) A - 3, B - 4, C - 2, D - 1
(5) A - 3, B - 4, C - 1, D - 2 (......)

**19.** පහත දැක්වෙන්නේ මූල්‍ය කළමනාකරණ තීරණ කිහිපයකි.

A - කෙටි කාලීන ආයෝජන
B - උපචිත වියදම්
C - ලාභාංශ විභජනය
D - ණය ප්‍රාග්ධනය
E - ප්‍රාග්ධන සංචිත
F - හිමිකාරිත්ව ප්‍රාග්ධනය

ඉහත ද අතුරෙන් ප්‍රාග්ධන ව්‍යුහ පිළිබඳ තීරණ පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) A, B, E (2) A, D, E (3) B, E, F (4) C, D, E (5) D, E, F (......)

**20.** නිෂ්පාදන ආයතනයක දැනට යන්ත්‍ර ක්‍රියාකරුවන් 80 දෙනෙකු සිටින අතර නිෂ්පාදන ප්‍රමාණ හා යන්ත්‍ර ක්‍රියාකරුවන් සංඛ්‍යාව අතර සෘජු සහසම්බන්ධතාවයක් පවතී. ආයතනය ඉදිරි වර්ෂයේ දී නිෂ්පාදනය 25% කින් වැඩි කිරීමට තීරණය කර ඇත. යන්ත්‍ර ක්‍රියාකරුවන් 16 දෙනෙකු ඉල්ලා අස්වීමේ ලිපි භාර දී ඇති අතර ඉදිරි වසර තුළ විශ්‍රාම යෑමට නියමිත යන්ත්‍ර ක්‍රියාකරුවන් සංඛ්‍යාව 04 කි. යන්ත්‍ර ක්‍රියාකරු තනතුරේ සිට සුපරීක්ෂක තනතුරට උසස්වීම් ලැබීමට නියමිත සංඛ්‍යාව 05 කි. අවශ්‍ය සේවක සංඛ්‍යාවෙන් 40%ක් බාහිරෙන් බඳවා ගැනීම ආයතනයේ ප්‍රතිපත්තිය නම් අභ්‍යන්තරයෙන් බඳවා ගත යුතු යන්ත්‍ර ක්‍රියාකරුවන් සංඛ්‍යාව කොපමණ ද?

(1) 13 (2) 18 (3) 20 (4) 21 (5) 27 (......)

**21.** පහත ද අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) දුරස්ථ පාලකය (Remote controller) ස්ථිරාංගයකි (Firmware).
(2) මධ්‍ය සැකසුම් ඒකකය (CPU) ජීවිකාංගයකි.
(3) මොනිටරය මෘදුකාංගයකි.
(4) පද්ධති ක්‍රියාකරු දෘඩාංගයකි.
(5) වෙබ් අඩවි දත්තයකි. (......)

**22.** ආනයන ක්‍රියාවලියේ දී භාවිතා වන 'ණයවර ලිපියකට' සම්බන්ධ **නොවන** පාර්ශ්වය වන්නේ

(1) ආනයනකරු ය.
(2) අපනයනකරු ය.
(3) ආනයනකරුගේ බැංකුව ය.
(4) අපනයනකරුගේ බැංකුව ය.
(5) රක්ෂණ සමාගම ය. (......)

**23.** ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් තොරතුරු වර්ගීකරණයෙහි නිර්ණායකය වන්නේ

(1) මූලාශ්‍රයයි.
(2) කළමනාකරණ මට්ටමයි.
(3) සම්භාවිතාවයි.
(4) ස්වභාවයයි.
(5) කාලයයි. (......)

**24.** 'රැකියා විස්තරයක්' යනු රැකියාවකට අයත්

(1) කාර්යයන්, යුතුකම්, වගකීම් හා සේවා කොන්දේසි අඩංගු ලැයිස්තුවකි.
(2) සුදුසුකම්, වගකීම්, කාර්යයන් හා තොරතුරු අඩංගු ලැයිස්තුවකි.
(3) සුදුසුකම්, වගකීම්, යුතුකම් හා කාර්යයන් අඩංගු ලැයිස්තුවකි.
(4) කාර්යයන්, සේවක ගුණාංග, යුතුකම් හා සුදුසුකම් අඩංගු ලැයිස්තුවකි.
(5) යුතුකම්, පලපුරුද්ද, සේවා කොන්දේසි හා වගකීම් අඩංගු ලැයිස්තුවකි. (......)

25. ආයතනයක් සෑම මට්ටමක ම සේවකයින්ගෙන් සමන්විත කමිටුවක් මගින්, ආංශික සැලසුම් පදනම් කරගෙන 2018-2020 කාලසීමාව සඳහා ව්‍යාපාරයේ සංයුක්ත සැලැස්ම සකස් කරනු ලබයි.
මෙම ප්‍රකාශයේ අඩංගු සැලසුම් කිරීමේ මූලධර්ම ගණන
(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (……)

26. 'සම්බන්ධතා අලෙවිකරණ සංකල්පය' වඩාත් හොඳින් විස්තර කරන අලෙවිකරණ කාර්යයන් අඩංගු ප්‍රකාශය වන්නේ
(1) ගනුදෙනුකරුවන්ගේ දිගුකාලීන තෘප්තිය හා විශ්වාසය තහවුරු කිරීම යන්නයි.
(2) සමාජයේ දිගුකාලීන අවශ්‍යතා තෘප්තිමත් කිරීම යන්නයි.
(3) සමාජ ජාල භාවිත කරමින් ගනුදෙනු සිදු කිරීම යන්නයි.
(4) භාණ්ඩ හා සේවා අවසාන පාරිභෝගිකයන්ට අලෙවි කිරීම යන්නයි.
(5) වෙළෙඳපොළ තරගයට මුහුණදීමට අලෙවි ප්‍රවර්ධනය භාවිතා කිරීම යන්නයි. (……)

27. සේවකයින් තෝරා ගැනීමක දී භාවිත කරන පරීක්ෂණ ක්‍රමය හා එහි අරමුණ නිවැරදිව සඳහන් වන ප්‍රකාශය තෝරන්න.
(1) විවිධ මානසික හැකියා පරීක්ෂා කිරීමට බුද්ධි පරීක්ෂණ යොදා ගනී.
(2) අවස්ථාවට මුහුණදීමට ඇති හැකියාව පරීක්ෂා කිරීමට පසුබිම් පරීක්ෂාව යොදා ගනී.
(3) විශේෂ වෘත්තීය කුසලතා පරීක්ෂා කිරීමට වෛද්‍ය පරීක්ෂණ යොදා ගනී.
(4) අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීමට ප්‍රායෝගික පරීක්ෂණ යොදා ගනී.
(5) අත් අකුරු පරීක්ෂා කිරීමට අභියෝග්‍යතා පරීක්ෂණ යොදා ගනී. (……)

28. ව්‍යාපාර සැලැස්මක් සැකසීමේ මූලික අරමුණ
(1) ප්‍රාග්ධන අවශ්‍යතා සපයා ගැනීම ය.
(2) ව්‍යාපාර ශක්‍යතාවය ඇගයීම හා පවත්වාගෙන යාමට මග පෙන්වීම ය.
(3) විවිධ පාර්ශ්වකරුවන්ට ව්‍යාපාරය ගැන අවබෝධයක් ලබා දීම ය.
(4) ව්‍යාපාරය සඳහා යෝග්‍ය ස්ථානයක් තෝරා ගැනීම ය.
(5) රජයේ ප්‍රතිලාභ ලබා ගැනීම ය. (……)

29. 'අණකරු විමසනු' යන අගරු සටහන චෙක්පතක යොදන්නේ කිනම් අවස්ථාවක ද?
(1) අණකරු විසින් ගෙවීම් නතර කර ඇති අවස්ථාවක
(2) අණකරු බුන්වත් වී ඇති අවස්ථාවක
(3) චෙක්පතෙහි ලිඛිත වැරදි ඇති අවස්ථාවක
(4) ගිණුමේ ප්‍රමාණවත් මුදල් නොමැති අවස්ථාවක
(5) 'ගානිෂි' නියෝගයක් ලැබී ඇති අවස්ථාවක (……)

30. අලෙවිකරණ කළමනාකරුවන් විසින් ප්‍රජා විද්‍යා පරිසරය විශ්ලේෂණය කිරීමට බලපාන ආසන්නතම හේතුව වන්නේ
(1) පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා අධ්‍යයනය කිරීම ය.
(2) පාරිභෝගික චර්යාවේ විචලතාව හඳුනා ගැනීම ය.
(3) වෙළෙඳපොළ ඛණ්ඩන විශාලත්වය හා වර්ධනය හඳුනා ගැනීම ය.
(4) ව්‍යාපාර චක්‍රය පුරෝකථනය කිරීම ය.
(5) දේශපාලන වෙනස්වීම් හඳුනා ගැනීම ය. (……)

**2.1.3** I ප්‍රශ්න පත්‍රයේ අංක 1 සිට **30** තෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 2 | 16. | 5 |
| 02. | 3 | 17. | 5 |
| 03. | 4 | 18. | 4 |
| 04. | 4 | 19. | 5 |
| 05. | 2 | 20. | 5 |
| 06. | 3 | 21. | 1 |
| 07. | 2 | 22. | 5 |
| 08. | 3 | 23. | 4 |
| 09. | 5 | 24. | 1 |
| 10. | 1 | 25. | 3 |
| 11. | 3 | 26. | 1 |
| 12. | 2 | 27. | 1 |
| 13. | 5 | 28. | 2 |
| 14. | 4 | 29. | 4 |
| 15. | 1 | 30. | 3 |

වගුව **5**

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **60** කි.

## 2.1.4 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ




ප්‍රස්තාරය 5

අයදුම්කරුවන්ගෙන් අඩු ම ප්‍රතිශතයක් නිවැරදි ප්‍රතිචාර දක්වා ඇති ප්‍රශ්නය වන්නේ 30 වැනි ප්‍රශ්නය යි. මෙහි පහසුතාව 35% කි

**2.1.5 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)**

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | Missing |
| 1 | 2 | 0.83 | **98.27** | 0.40 | 0.27 | 0.23 | - |
| 2 | 3 | 0.47 | 0.77 | **98.33** | 0.17 | 0.20 | 0.06 |
| 3 | 4 | 1.23 | 3.07 | 1.97 | **91.97** | 1.56 | 0.20 |
| 4 | 4 | 0.23 | 0.37 | 0.03 | **99.17** | 0.13 | 0.07 |
| 5 | 2 | 16.67 | **59.77** | 18.20 | 3.23 | 1.73 | 0.40 |
| 6 | 3 | 0.26 | 2.50 | **95.37** | 0.70 | 0.97 | 0.20 |
| 7 | 2 | 7.87 | **61.10** | 9.40 | 14.50 | 6.77 | 0.36 |
| 8 | 3 | 4.34 | 26.83 | **43.40** | 20.03 | 4.93 | 0.47 |
| 9 | 5 | 5.60 | 12.10 | 2.40 | 6.43 | **73.33** | 0.14 |
| 10 | 1 | **67.97** | 12.40 | 8.70 | 9.20 | 1.23 | 0.50 |
| 11 | 3 | 3.53 | 13.23 | **71.27** | 7.24 | 3.93 | 0.80 |
| 12 | 2 | 14.14 | **76.50** | 5.20 | 2.40 | 1.43 | 0.33 |
| 13 | 5 | 2.73 | 0.80 | 0.80 | 2.00 | **93.50** | 0.17 |
| 14 | 4 | 2.80 | 9.77 | 8.87 | **72.80** | 5.53 | 0.23 |
| 15 | 1 | **92.23** | 3.93 | 1.20 | 1.08 | 1.43 | 0.13 |
| 16 | 5 | 8.53 | 4.43 | 7.07 | 13.47 | **65.83** | 0.67 |
| 17 | 5 | 0.67 | 10.40 | 10.57 | 4.00 | **73.83** | 0.53 |
| 18 | 4 | 0.33 | 0.60 | 0.23 | **92.47** | 6.20 | 0.17 |
| 19 | 5 | 1.33 | 7.47 | 3.63 | 7.63 | **79.60** | 0.34 |
| 20 | 5 | 8.63 | 16.53 | 17.77 | 12.57 | **43.57** | 0.93 |
| 21 | 1 | **48.57** | 13.50 | 12.90 | 3.33 | 21.10 | 0.60 |
| 22 | 5 | 1.33 | 3.90 | 3.23 | 7.80 | **83.50** | 0.24 |
| 23 | 4 | 10.80 | 10.10 | 2.97 | **73.50** | 2.30 | 0.33 |
| 24 | 1 | **69.43** | 15.80 | 6.93 | 3.80 | 3.83 | 0.21 |
| 25 | 3 | 4.97 | 20.40 | **43.50** | 24.50 | 5.87 | 0.76 |
| 26 | 1 | **56.10** | 10.47 | 17.03 | 9.10 | 6.70 | 0.60 |
| 27 | 1 | **58.10** | 24.30 | 1.07 | 14.57 | 1.73 | 0.23 |
| 28 | 2 | 6.00 | **63.13** | 28.20 | 1.87 | 0.60 | 0.20 |
| 29 | 4 | 35.74 | 3.40 | 10.27 | **39.83** | 10.43 | 0.33 |
| 30 | 3 | 36.73 | 23.90 | **35.47** | 2.13 | 1.33 | 0.44 |

වගුව **6**

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

* Missing යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති අපේක්ෂකයින්ගේ ප්‍රතිශතය යි.

* I පත්‍රයේ ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා පිළිතුරු සැපයීමේ දී, වරණ තෝරා ඇති ප්‍රතිශතික අගය දක්වා ඇත.

උදා:- 04 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් එනම් 99% ක් නිවැරදි ප්‍රතිචාර දක්වා තිබේ.

**2.1.6 I ප්‍රශ්න පත්‍රයේ අංක 1 - 30 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා**

1-30 දක්වා බහුවරණ ප්‍රශ්න සැළකූ විට ප්‍රශ්න අංක 08, 20, 21, 25, 29 හා 30 යන ප්‍රශ්නවල පහසුතාව 50%කට වඩා අඩු ය. එම ප්‍රශ්නවලට අදාළ ඒකක හා එක් එක් ප්‍රශ්නවල පහසුතාව පහත දැක්වේ.

| ප්‍රශ්න අංක | පාඩම් ඒකක | පහසුතාව |
|---|---|---|
| 08 | ව්‍යාපාර සංවිධාන | 43% |
| 20 | මානව සම්පත් කළමනාකරණය | 44% |
| 21 | ව්‍යාපාර තොරතුරු පද්ධති | 49% |
| 25 | ව්‍යාපාර කළමනාකරණය | 44% |
| 29 | මුදල් හා බැංකු | 40% |
| 30 | අලෙවි කළමනාකරණය | 35% |

**ප්‍රශ්න අංක 08 (ඒකකය - ව්‍යාපාර සංවිධාන)**

මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර වූ තෙවන වරණය තෝරාගෙන දක්වා ඇත්තේ අපේක්ෂකයන් ගෙන් 43%ක් පමණි. වැඩි අපේක්ෂකයන් පිරිසක් වැරදි වරණයක් තෝරා ගැනීමට හේතුව වනුයේ ප්‍රශ්නයෙන් විමසූ මූලික හරය පිළිබඳ අවබෝධයක් නොමැති වීමයි. එක් එක් ව්‍යාපාර සංවිධාන වල ලක්ෂණ පිළිබඳ නිශ්චිත අවබෝධයක් ලබා දීමට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම සුදුසු වේ.

**ප්‍රශ්න අංක 20 (ඒකකය - මානව සම්පත් කළමනාකරණය)**

මෙම ප්‍රශ්නයෙහි නිවැරදි වූ පස්වන වරණයට ප්‍රතිචාර දක්වා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 44%ක් පමණි. මෙහි දී වැඩි පිරිසක් වැරදි වරණය තෝරා ගැනීමට හේතුව වනුයේ සිද්ධියක් ඇසුරෙන් විමසා ඇති ගැටළු විසඳීමට අපේක්ෂකයන් අපොහොසත් වීමයි. එම නිසා න්‍යායාත්මක දැනුමට අදාළව ප්‍රායෝගික සිද්ධීන් හා සම්බන්ධ ගැටළු විසඳීමට පන්ති කාමරය තුළ දී අවධානය යොමු කිරීම සුදුසු ය.

**ප්‍රශ්න අංක 21 (ඒකකය - ව්‍යාපාර තොරතුරු පද්ධති)**

මෙම ප්‍රශ්නයෙහි නිවැරදි වූ පළමු වරණයට ප්‍රතිචාර දක්වා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 49%ක් පමණි. මෙහි දී වැඩි පිරිසක් වැරදි වරණයක් තෝරා ගැනීමට හේතුව වනුයේ ව්‍යාපාර තොරතුරු පද්ධති පිළිබඳ සංකල්පමය අවබෝධයක් නොමැති වීමයි. එම නිසා තොරතුරු පද්ධති පිළිබඳ න්‍යායාත්මක දැනුම යාවත්කාලීන වන පරිදි ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිතව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතු ය.

**ප්‍රශ්න අංක 25 (ඒකකය - ව්‍යාපාර කළමනාකරණය)**

මෙම ප්‍රශ්නයෙහි නිවැරදි වූ තෙවන වරණයට ප්‍රතිචාර දක්වා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 44%ක් පමණි. මෙසේ වැඩි පිරිසක් වැරදි වරණයක් තෝරා ගැනීමට හේතුව වනුයේ ප්‍රශ්නයෙන් විමසන ලද සැලසුම් කිරීමේ මූලධර්ම පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති වීමයි. සැලසුම් කිරීමේ මූලධර්ම පිළිබඳව න්‍යායාත්මක කරුණු වඩාත් නිවැරදි ලෙස මතකයේ රැඳෙන පරිදි අපේක්ෂකයන් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට යොමු කළ යුතු ය.

**ප්‍රශ්න අංක 29 (ඒකකය - මුදල් හා බැංකු)**

මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර වූ හතරවන වරණයට ප්‍රතිචාර දක්වා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 40%ක් පමණි. මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සැපයීමට අපේක්ෂකයන් අපොහොසත් වී ඇත. එම නිසා චෙක්පත් භාවිතය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පන්තිකාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළට ඇතුළත් කිරීම සුදුසු ය.

**ප්‍රශ්න අංක 30 (ඒකකය - අලෙවි කළමනාකරණය)**

මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර වූ තෙවන වරණයට ප්‍රතිචාර දක්වා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 35%ක් වන සුළු පිරිසකි. එයට හේතුව අලෙවි කළමණාකරුවන් ප්‍රජා විද්‍යාත්මක පරිසරය විශ්ලේෂණය කිරීමට බලපාන ආසන්නතම හේතුව අපේක්ෂකයින් විසින් නිශ්චිතව හඳුනාගෙන පිළිතුරු සපයා නොතිබීමයි. මෙවැනි ගැටළුවලට පිළිතුරු සැපයීම සඳහා පන්ති කාමරය තුළ දී සුදුසු පැවරුම් ලබාදීමෙන් අපේක්ෂකයන්ගේ අවබෝධය පුළුල් කළ යුතු ය.

**2.1.7 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්න, අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

- අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) භාණ්ඩවලට හෝ සේවාවලට ඇති .................................................... මත ඉල්ලුම ජනිත වන අතර .............................................. මගින් එය සඵල ඉල්ලුමක් බවට පරිවර්තනය වේ.

(ආ) ව්‍යාපාර, රටක .......................................... හා .......................................... සඳහා දායක වේ.

**පිළිතුරු**

(අ) වුවමනා, ක්‍රය ශක්තිය **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

(ආ) පැවැත්ම හා සංවර්ධනය **(අනුපිළිවෙල අවශ්‍ය නොවේ.)**

**32.** (අ) ව්‍යාපාර ක්‍රියාකාරකම් හොඳ හා නරක වශයෙන් ඇගයීම් කොට හොඳ දේ ක්‍රියාත්මක කිරීම ව්‍යාපාර ................................. ලෙස ද මානව හා ස්වාභාවික පරිසර සංවර්ධනයට ව්‍යාපාරවල ඇති ධනාත්මක බැඳීම .............................................. ලෙස ද හැඳින්වේ.

(ආ) දුම්කොළ හා මද්‍යසාර බදු .............................................. දෙපාර්තමේන්තුව මගින් එකතු කරන අතර, උපයන විට ගෙවීම් (PAYE) බදු .............................................. දෙපාර්තමේන්තුව විසින් එකතු කරයි.

**පිළිතුරු**

(අ) ආචාරධර්ම, සමාජ වගකීම්/ වගකීම් **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

(ආ) සුරාබදු, දේශීය ආදායම් **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

**33.** (අ) ජාත්‍යන්තර වෙළඳ ගිවිසුමක මූලික අරමුණ වන්නේ භාණ්ඩ හා සේවා සඳහා.......................... නිර්මාණය කර ගැනීම හා ජාත්‍යන්තර .............................................. වර්ධනය කර ගැනීමයි.

(ආ) බිල්පත් ඉක්මනින් ගෙවීම .................................................... වට්ටම් මගින් උනන්දු කර අතර .............................................. වට්ටම් මගින් වැඩි භාණ්ඩ ප්‍රමාණයක් මිල දී ගැනීමට උනන්දු කරවයි.

**පිළිතුරු**

(අ) වෙළඳපොලක්, සම්බන්ධතා/ සහයෝගීතාව **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

(ආ) මුදල්, ප්‍රමාණ **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

**34.** (අ) කොළඹ කොටස් හුවමාරුවෙහි කිසියම් ලැයිස්තුගත සමාගමක කොටස්, මූල්‍ය යෝග්‍යතාවය, ............................ හා ........................................... යන නිර්ණායක සපුරන්නේ නම් පමණක් ඒවා S&P SL20 දර්ශකයට ඇතුළත් කිරීමට සුදුසුකම් ලබයි.

(ආ) අරමුදල් සම්පාදනයේ දී ........................................... කල්බදු ක්‍රමය මගින් කල්බදු ලාභියාට අයිතිය නොපවරා දේපළ භාවිතයට පමණක් ඉඩ දෙනු ලබන අතර ..................................... කල්බදු ක්‍රමය මගින් අවදානම හා ප්‍රතිලාභ කල්බදු ලාභියාට පවරමින් දේපළ භාවිතයට ඉඩ දෙයි.

**පිළිතුරු**

(අ) විශාලත්වය, ද්‍රවශීලත්වය **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

(ආ) මෙහෙයුම්/ ක්‍රියාකාරී, මූල්‍ය **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

**35.** (අ) සන්නිවේදන ක්‍රියාවලියට අදාළ පහත සටහනෙහි හිස්තැන් සම්පූර්ණ කරන්න.




**පිළිතුරු**

1. අදහස
2. ආකේතනය
3. විකේතනය
4. ප්‍රතිචාරය / ප්‍රතිපෝෂණය **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

**36.** (අ) අධිකාරී බලය ස්ථාපිත වී ඇති ආකාරය අනුව සංවිධානයක් ............................ හා ................ ............................ වශයෙන් වර්ග කළ හැකිය.

(ආ) කළමණාකරුවන්ට සංයුක්ත සැලැස්මක් සකස් කිරීමේ දී මූලිකව ම තිබිය යුත්තේ ........................................... කුසලතා වන අතර අවසාන ගිණුම් සකස් කිරීමේ දී ඔවුනට ........................................... කුසලතා තිබිය යුතු වේ.

**පිළිතුරු**

(අ) මධ්‍යගත, විමධ්‍යගත **(අනුපිළිවෙල අවශ්‍ය නොවේ.)**

(ආ) සංකල්පනාත්මක, තාක්ෂණික **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

**37.** පහත දැක්වෙන සමීකරණවල සත්‍ය හෝ අසත්‍ය බව සඳහන් කරන්න.

| | **සමීකරණය** | | **සත්‍ය/ අසත්‍ය** |
|---|---|---|---|
| 1 | සමච්ඡේදන ලක්ෂ්‍යය | = ස්ථාවර පිරිවැය ÷ දායකය | ............................ |
| 2 | දායකය | = ඒකකයක විකුණුම් මිල ÷ ඒකකයක විචල්‍ය පිරිවැය | ............................ |
| 3 | ක්ෂණික අනුපාතය | = මුළු වත්කම් ÷ ජංගම වත්කම් | ............................ |
| 4 | පොලී ආවරණ අනුපාතය | = පොලී හා බදුවලට පෙර ලාභය ÷ පොලිය | ............................ |

**පිළිතුරු**

1 සත්‍ය
2 අසත්‍ය
3 අසත්‍ය
4 සත්‍ය

**38.** (අ) නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කරනු ලබන්නේ .............................. අභිමුඛ නායකත්වය වන අතර සේවක අභිමුඛ නායකත්වය .................................... කෙරෙහි අවධානය යොමු කරනු ලබයි.

(ආ) නියමිත සේවා කාලයට අමතරව වැඩ කරන කාලය වෙනුවෙන් ගෙවන්නේ .......................... වන අතර ඉලක්කගත ප්‍රමාණයට වඩා වැඩියෙන් කරන නිෂ්පාදනය සඳහා නිෂ්පාදන ............................................ ගෙවනු ලබයි.

**පිළිතුරු**

(අ) කාර්ය/ නිෂ්පාදන, සේවකයන්/ මානව සම්බන්ධතා **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**
(ආ) අතිකාල, දිරි දීමනා **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

**39.** (අ) හරිත නිෂ්පාදනයේ දී භාවිතා කළ හැකි අපතය කළමණාකරණ ක්‍රියාකාරකම් තුන වනුයේ, අවම කිරීම (Reduce), ............................... හා ............................................වේ.

(ආ) වටිනාකම හා ප්‍රමාණය අනුව වර්ග කර තොග පාලනය කිරීම ............................................ ක්‍රමය ලෙස ද, ශූන්‍ය මට්ටමක් පවත්වා ගනිමින් තොග පාලනය කිරීම.................................... ක්‍රමය ලෙස ද හඳුන්වයි.

**පිළිතුරු**

(අ) (Re-Use) නැවත භාවිතය, (Re-Cycle) ප්‍රතිචක්‍රීකරණය **(අනුපිළිවෙල අවශ්‍ය නොවේ.)**
(ආ) ABC, JIT **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

**40.** (අ) ගනුදෙනුකාර වටිනාකම යනු පාරිභෝගිකයා කිසියම් නිෂ්පාදිතයක් පිළිබඳ සංජානනය කරගනු ලැබූ (හඳුනාගත්) ............................ සමග............................... ගැළපීමයි.

(ආ) අඩු........................... හා පුළුල්.........................................ආවරණය නිසා අන්තර්ජාලය තුළින් කෙරෙන අලෙවි ප්‍රවර්ධනය ජනප්‍රිය වෙමිනි පවතී.

**පිළිතුරු**

(අ) ප්‍රතිලාභ, පිරිවැය **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

(ආ) පිරිවැය, වෙළෙඳපොල **(අනුපිළිවෙල අවශ්‍ය වේ.)**

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

**41.** පහත ප්‍රමිතීන්ට අදාළ පද්ධති සහතිකකරණය (ක්ෂේත්‍රය) ලියන්න.

1. ISO 9001: 2015 ..........................................................................................
2. ISO 14001: 2015 ..........................................................................................
3. ISO 22000: 2005 ..........................................................................................
4. ISO 26000 ..........................................................................................

**පිළිතුරු**

1. තත්ත්ව කළමණාකරණ පද්ධති
2. පරිසර කළමණාකරණ පද්ධති
3. ආහාර සුරක්ෂිතතා කළමණාකරණ පද්ධති
4. සමාජ වගකීම් මාර්ගෝපදේශ

**42.** ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාර සඳහා රජය විසින් ලබා දෙන මූල්‍ය **නොවන** දිරිගැන්වීම් වර්ග **හතරක්** දක්වන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

**පිළිතුරු**

1. උපදේශන සේවා
2. තාක්ෂණික සේවා
3. යටිතල පහසුකම්
4. අලෙවිකරණ පහසුකම්

**43.** විද්‍යුත් වෙළෙඳාම සිදුවන ආකාර **හතරක්** දක්වන්න.

1. ..........................................................................................
2. ..........................................................................................
3. ..........................................................................................
4. ..........................................................................................

**පිළිතුරු**

1. ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට B 2 B
2. ව්‍යාපාරයෙන් ගනුදෙනුකරුට B 2 C
3. ගනුදෙනුකරුගෙන් ගනුදෙනුකරුට C 2 C

4. රජයෙන් පුරවැසියන්ට G 2 C
5. රජයෙන් ව්‍යාපාරයට G 2 B
6. ව්‍යාපාරයෙන් රජයට B 2 G
7. පුරවැසියන්ගෙන් රජයට G 2 G

**(ඉහත ඕනෑම කරුණු හතරක්)**

**44.** වෙළෙඳපොළ බණ්ඩණයක සඵලදායීතාවය තහවුරු කර ගැනීමට තිබිය යුතු අවශ්‍යතා **හතරක්** ලියන්න.
1. .......................................................................................................................................
2. .......................................................................................................................................
3. .......................................................................................................................................
4. .......................................................................................................................................

**පිළිතුරු**

1. මැනිය හැකි බව
2. ප්‍රමාණවත් බව
3. ළඟාවිය හැකි බව
4. වෙන්කොට හඳුනාගත හැකි බව
5. ක්‍රියාත්මක කළ හැකි බව

**(ඉහත ඕනෑම කරුණු හතරක්)**

**45.** ව්‍යාපාරයකට ලබා ගත හැකි ඍජු මූල්‍ය සම්පාදන මාර්ග **හතරක්** දක්වන්න.
1. .......................................................................................................................................
2. .......................................................................................................................................
3. .......................................................................................................................................
4. .......................................................................................................................................

**පිළිතුරු**

1. රඳවාගත් ලාභ
2. ක්ෂය වෙන් කිරීම
3. කොටස් නිකුත් කිරීම
4. ණයකර නිකුත් කිරීම

**46.** කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් වර්ග **හතරක්** නම් කරන්න.
1. .......................................................................................................................................
2. .......................................................................................................................................
3. .......................................................................................................................................
4. .......................................................................................................................................

**පිළිතුරු**

1. සාමාන්‍ය කොටස්
2. වරණීය කොටස්
3. කොටස් බලපත්‍ර
4. සාංගමික ණයකර
5. රජයේ ණය සුරැකුම්පත්

**(ඉහත ඕනෑම කරුණු හතරක්)**

**47.** ආයතනයක මානව සම්පත් කළමණාකරණයේ සාර්ථකත්වය ඇගයීම සඳහා භාවිත කළ හැකි නිර්ණායක **හතරක්** සඳහන් කරන්න.

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................

**පිළිතුරු**

1. ශ්‍රම පිරිවැටුම
2. සේවක ප්‍රවාසිතාව
3. ශ්‍රම ඵලදායීතාවය
4. කාර්මික සම්බන්ධතා

**48.** පහත සඳහන් රූපසටහන්වලින් නිරූපණය කෙරෙන පරිගණක ජාල නම් කරන්න.

1.  ..........................................................................

2.  ..........................................................................

3.  ..........................................................................

4.  ..........................................................................

**පිළිතුරු**

1. මුදු ජාල
2. තාරකා ජාල
3. ශාඛ ජාල (රුක් ජාල)
4. බස් ජාල

**49.** දත්ත සැකසීමේ තාක්ෂණය වර්ග කළ හැකි ආකාර **හතර** නම් කරන්න.

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................

**පිළිතුරු**

1. හස්ත ක්‍රමය
2. අර්ධ හස්ත ක්‍රමය
3. විද්‍යුත් යාන්ත්‍රික
4. විද්‍යුත් දත්ත සැකසීම ( ඉලෙක්ට්‍රොනික දත්ත සැකසීම)

**50.** ව්‍යාපාරයක ශක්‍යතා අධ්‍යයනයේ දී අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර **හතරක්** සඳහන් කරන්න.

1. ..........................................................................................................................
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................

**පිළිතුරු**

1. අලෙවි
2. මූල්‍ය
3. තාක්ෂණික
4. නීතිමය
5. පාරිසරික
6. සම්පත්
7. සමාජ හා සංස්කෘතික

**2.1.8** I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ




ප්‍රස්තාරය 6

### 2.1.9 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා ලකුණු ලබා ඇති ආකාරය

| ප්‍රශ්න අංකය | ලකුණු ලබාගත් ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|
| | ලකුණු 0 | ලකුණු 0.5 | ලකුණු 1 | ලකුණු 1.5 | ලකුණු 2 | ප්‍රතිචාර නොදැක්වූ |
| 31 | 9.73% | 21.20% | 41.40% | 22.30% | 4.84% | 0.53% |
| 32 | 6.73% | 16.07% | 26.60% | 42.80% | 6.97% | 0.83% |
| 33 | 19.57% | 26.63% | 30.87% | 20.20% | 1.83% | 0.90% |
| 34 | 38.17% | 7.80% | 39.73% | 7.93% | 3.30% | 3.07% |
| 35 | 8.30% | 3.33% | 31.38% | 11.20% | 44.82% | 0.97% |
| 36 | 34.81% | 10.44% | 28.88% | 5.97% | 17.04% | 2.86% |
| 37 | 1.37% | 5.94% | 19.67% | 31.38% | 41.47% | 0.17% |
| 38 | 6.73% | 12.77% | 17.90% | 48.13% | 13.04% | 1.43% |
| 39 | 12.87% | 13.77% | 21.50% | 21.47% | 28.27% | 2.12% |
| 40 | 20.58% | 36.46% | 32.19% | 5.77% | 2.43% | 2.57% |
| 41 | 37.08% | 18.11% | 20.24% | 17.71% | 4.60% | 2.26% |
| 42 | 13.37% | 19.64% | 23.97% | 23.57% | 18.42% | 1.03% |
| 43 | 35.80% | 1.33% | 2.43% | 9.23% | 49.71% | 1.50% |
| 44 | 58.10% | 4.37% | 6.23% | 8.90% | 16.73% | 5.67% |
| 45 | 23.13% | 17.50% | 20.60% | 19.43% | 17.87% | 1.47% |
| 46 | 16.53% | 29.17% | 25.93% | 20.20% | 5.84% | 2.33% |
| 47 | 44.80% | 13.70% | 12.03% | 15.70% | 10.00% | 3.77% |
| 48 | 14.00% | 4.80% | 9.03% | 15.23% | 55.81% | 1.13% |
| 49 | 68.03% | 2.03% | 3.47% | 9.60% | 11.64% | 5.23% |
| 50 | 41.11% | 12.80% | 13.17% | 16.47% | 12.55% | 3.90% |

වගුව 7

* I පත්‍රයේ ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට ලකුණු ලබාගත් ප්‍රතිශතය ලකුණු 0, ලකුණු 0.5, ලකුණු 01, ලකුණු 1.5 හා ලකුණු 02 තීරුවලින් දැක්වේ.

* ''ප්‍රතිචාර නොදැක්වූ'' යනුවෙන් දක්වා ඇත්තේ ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා නොමැති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතයයි.

  උදා :- අපේක්ෂකයන්ගෙන් 56%ක් ප්‍රශ්න අංක 48 සඳහා සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇති අතර, ප්‍රශ්න අංක 33 හා 40 සඳහා සම්පූර්ණ ලකුණු ලබාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 2%ක් පමණ වේ.

### 2.1.10 I ප්‍රශ්න පත්‍රයේ අංක 31 - 50 තෙක් ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිගමන හා යෝජනා

31 සිට 50 දක්වා වූ පිළිතුරු සැපයීමේ ප්‍රශ්න සැලකූ විට ප්‍රශ්න අංක 34, 40, 41, 44, 47, සහ 49 යන ප්‍රශ්නවල පහසුතාව 35%ට වඩා අඩුය.

**ප්‍රශ්න අංක 34 (ඒකකය - කළමනාකරණය)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ පහසුතාවය 31%කි. මෙහි (අ) හි S & P SL 20 දර්ශකයට ඇතුළත් කිරීමේ දී සමාගම් විසින් සපුරාලිය යුතු සුදුසුකම් පිළිබඳ යාවත්කාලීන දැනුම අපේක්ෂකයන්ට තිබිය යුතු ය. එමෙන්ම මෙහි (ආ) හි කල්බදුකරණය පිළිබඳව අවබෝධය මඳ බව නිසා නිශ්චිත පිළිතුරු සපයා නොතිබුණි. එම නිසා කල්බදුකරණය පිළිබඳ අවබෝධය තහවුරු වන පරිදි ශිෂ්‍යයන් ක්‍රියාකාරකම්වල නිරත කරවීම සුදුසු වේ.

**ප්‍රශ්න අංක 40 (ඒකකය - අලෙවි කළමනාකරණය)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ පහසුතාවය 32%කි. මෙසේ පහසුතාවය අඩු වීමට හේතුව අලෙවිකරණයේ දී අදාළ පාරිභාෂික යෙදුම් පිළිබඳව අවබෝධය ප්‍රමාණවත්ව නොතිබීමයි. එම නිසා අලෙවිකරණයේ දී භාවිත වන විවිධ යෙදුම් පිළිබඳව අවබෝධය තහවුරු වන පරිදි පන්ති කාමරය තුළ දී ක්‍රියාකාරකම් සිදු කිරීම යෝග්‍ය වේ.

**ප්‍රශ්න අංක 41 (ඒකකය - රජය හා ව්‍යාපාර අතර සම්බන්ධතාව)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ පහසුතාවය 33%කි. මෙසේ පහසුතාවය අඩු මට්ටමක පැවතීමට හේතුව වූයේ ජාත්‍යන්තර ප්‍රමිති පද්ධති සහතිකකරණය පිළිබඳ දැනුම යාවත්කාලීන නොවීමයි. ප්‍රමිති පද්ධති සහතිකකරණ පිළිබඳ යාවත්කාලීන දැනුම තහවුරු කරගැනීමට පැවරුම් ආශ්‍රිතව ක්‍රියාකාරකම් සංවිධානය කර ගැනීමට යෝග්‍ය වේ.

**ප්‍රශ්න අංක 44 (ඒකකය - අලෙවි කළමනාකරණය)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ පහසුතාවය 28%කි. මෙසේ පහසුතාවය අඩු මට්ටමක පැවතීමට හේතු වූයේ ප්‍රශ්නයේ හරය කියවා අවබෝධ කර ගැනීමට නොහැකි වීමයි. ප්‍රශ්නයක් කියවා තේරුම් ගැනීමේ කුසලතා වර්ධනය වන පරිදි ශිෂ්‍යයන් අභ්‍යාසවල නිරත කරවීමට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගත යුතු ය.

**ප්‍රශ්න අංක 47 (ඒකකය - මානව සම්පත් කළමනාකරණය)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ පහසුතාවය 31%කි. ලකුණු ලබා නොගත් පිරිස 45%කි. පිළිතුරු සැපයීමේ දී ඉහළ ලකුණක් ලබා ගැනීම සඳහා ආයතනයක මානව සම්පත් කළමනාකරණයේ සාර්ථකත්වය ඇගයීම සඳහා භාවිත කළ හැකි නිර්ණායක පිළිබඳව නිවැරදි අවබෝධයක් තිබිය යුතු ය. එබැවින් එකී නිර්ණායක පිළිබඳව අවබෝධයක් ලැබෙන පරිදි පන්ති කාමරය තුළ දී ශිෂ්‍යයන්ට මග පෙන්වීම වැදගත් වේ.

**ප්‍රශ්න අංක 49 (ඒකකය - ව්‍යාපාර තොරතුරු පද්ධතිය)**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ පහසුතාවය 21%කි. ලකුණු ලබා නොගත් පිරිස 68%කි. සම්පූර්ණ ලකුණු හිමි කරගත් පිරිස 12%ක් පමණ වේ. පිළිතුරු සැපයීමේ දී පහසුතාව මේ අයුරින් පහළ මට්ටමක පැවතීමට හේතුව දත්ත හා තොරතුරු පිළිබඳ පැහැදිලි අවබෝධයකින් තොරව පිළිතුරු සැපයීමයි. එබැවින් ප්‍රශ්නයක් නිවැරදිව අවබෝධ කරගෙන පිළිතුරු සැපයීම පිළිබඳව අපේක්ෂකයන්ගේ අවධානය යොමු කළ යුතු ය.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**කාලය පැය 03 කි. මුළු ලකුණු 100 කි.**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය.

**I කොටස** - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි.

**II කොටස** - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි.

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතුය.

* එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

* ප්‍රශ්න පත්‍ර දෙක සඳහා අවසාන ලකුණු ගණනය කිරීම

| | | |
|---|---|---|
| I පත්‍රය සඳහා ලකුණු | = | 100 |
| II පත්‍රය සඳහා ලකුණු | = | 100 |
| අවසාන ලකුණු | = | 200 / 2 |
| | = | 100 |

**2.2.2** II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

| |
|---|
| II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1 හා 4.2 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත. |

## II පත්‍රය

### I කොටස

**1 ප්‍රශ්නය**

(i) (අ) ව්‍යාපාරයක අරමුණු **හතරක්** ලැයිස්තුගත කරන්න.

(1) ලාභය උපරිම කිරීම.
(2) විකුණුම් උපරිම කිරීම.
(3) වෙළෙඳපොල තුළ රැඳී සිටීම/ අඛණ්ඩ පැවැත්ම.
(4) වෙළෙඳපොල කොටස වැඩි කිරීම.
(5) ව්‍යාපාරයේ ප්‍රතිරූපය හා කීර්තිනාමය වර්ධනය කිරීම.
(6) තරගකාරීත්වය වර්ධනය කිරීම.
(7) කොටසක අගය වැඩිකර ගැනීම.
(8) වෙළෙඳපොල පුළුල් කරගැනීම.
(9) සමාජ වගකීම් ඉටුකිරීම/ සමාජ සුභ සාධනය.
(10) ගුණත්ව නායකත්වය.
(11) නව්‍යතා සම්පාදනය **(½ × 4 = ලකුණු 02යි)**

(ආ) "නිෂ්පාදිත, භාණ්ඩ හා සේවාවලට පමණක් සීමා නොවේ." නිෂ්පාදිත වශයෙන් සැලකිය හැකි භාණ්ඩ හා සේවා නොවන දෑ
නම් කරන්න.

(1) අදහස්
(2) ඉසව්
(3) පුද්ගලයන්
(4) සංවිධාන
(5) දේපල
(6) තොරතුරු
(7) අත්දැකීම් / පලපුරුද්ද
(8) ස්ථාන **(½ × 4 = ලකුණු 02යි)**

**(ලකුණු 04යි)**

(ii) (අ) පාරිභෝගික භාණ්ඩ වර්ගීකරණයට අනුව 'ලී බඩු' හා 'ශබ්දමාලාව' (Glossary) යන භාණ්ඩ අයත් වන වර්ගීකරණය වෙන වෙනම දක්වන්න.

ලී බඩු - සාප්පු භාණ්ඩ
ශබ්ද මාලාව - නොසෙවූ භාණ්ඩ **(1 × 2 = ලකුණු 02යි)**

(ආ) ඉහත (ii) (අ)හි ඇති භාණ්ඩ දෙක ඔබ සඳහන් කළ වර්ගීකරණයන්ට අයත් වන්නේ ඇයි දැයි හේතු සහිතව පැහැදිලි කරන්න.

සාප්පු භාණ්ඩ නිතර නිතර මිලදී නොගනී. එමෙන්ම මේවායේ මිල, ගුණත්වය, කල් පැවැත්ම එකිනෙකට වෙනස්ය. එහෙයින් මේවා මිලදී ගැනීමට පාරිභෝගිකයා කාලය හා ශ්‍රමය වැය කරයි. ලී බඩුවල මෙම ලක්ෂණ පවතින නිසා එය සාප්පු භාණ්ඩයකි.

**(කරුණු 2ක් සහිත පිළිතුරකට ලකුණු 01යි)**

නොසෙවූ භාණ්ඩ යනු මෙතෙක් මිලදී ගැනීමට කැමැත්තක් හෝ රුචිකත්වයක් ඇති වී නොමැති භාණ්ඩයයි. ශබ්ද මාලාව මූලික වශයෙන් විශේෂ අවශ්‍යතාවයක් ඉටු කරයි. එය නිතර නිතර අවශ්‍ය නොවේ. ප්‍රචාරණයක් හා ප්‍රවර්ධනයක්ද නොමැත. මිල දී ගත හැකි ස්ථාන සීමිතය. එම නිසා ශබ්ද මාලාව නොසෙවූ භාණ්ඩ ගණයට අයත් වේ.

**(කරුණු 2ක් සහිත පිළිතුරකට ලකුණු 01යි)**

(iii)(අ) පසුගිය වසර කිහිපය තුළ සංචාරක කර්මාන්තයෙන් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට ලැබුණු දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වීමට හේතු වූ කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(1) ශ්‍රී ලංකාවේ මුදලේ අගය අව ප්‍රමාණය වීම.
(2) විදේශ රටවල් සමඟ ශ්‍රී ලංකා රජය යහපත් සම්බන්ධතා ඇති කරගැනීම.
(3) යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
(4) සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ආයෝජනය ඉහළයාම.
(5) සාමකාමී වාතාවරණයක් පැවතීම.
(6) කලාපීය රටවල ආර්ථිකය දියුණු වීම.
(7) සංචාරක කර්මාන්තය සම්බන්ධව ජාත්‍යන්තර ප්‍රවර්ධනය සඵලදායී වීම විශේෂයෙන් චීනයේ.
(8) කලාපයේ අනෙක් රටවල අර්බුද පැවතීම **(1× 2 = ලකුණු 02යි)**

(ආ) සමහර ව්‍යාපාර ක්ෂේත්‍රවල රාජ්‍ය හා පෞද්ගලික අංශ තරගකාරීව ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින නමුත් පෞද්ගලික අංශයට වඩා රාජ්‍ය අංශයේ ව්‍යාපාරවලින් තම අවශ්‍යතා සපුරාගැනීමට ජනතාව පෙළඹීමට බලපාන කරුණු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(1) විශ්වාසය
(2) ලැදියාව
(3) මිල අඩු බව විශ්වාස කිරීම.
(4) වංචා රහිතයයි විශ්වාස කිරීම.
(5) පලපුරුදු හා සුදුසුකම් සහිත සේවකයන් සිටින බව විශ්වාස කිරීම.
(6) ආයතන සංස්කෘතිය
(7) ගනුදෙනුකරුවන් තුළ ඇති පුරුදු **(සඳහන් කිරීම ½× 2 = ලකුණු 01යි)**

**(විස්තර කිරීම ½× 2 = ලකුණු 01යි)**

(iv)(අ) ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වැඩිවීම, අවස්ථාවක් විය හැකි කර්මාන්තයක් හා තර්ජනයක් විය හැකි කර්මාන්තයක් බැගින් නම්කර, ඊට හේතු දක්වන්න.

අවස්ථා - සෞඛ්‍ය සේවා, වැඩිහිටි සුරැකුම් හා සාත්තු සේවා
තර්ජන - අධ්‍යාපන, රක්ෂණ, තොරතුරු සන්නිවේදන

(ඉහත දැක්වූයේ උදාහරණ කීපයක් පමණි. අපේක්ෂකයින් තම පිළිතුර සනාථ වන සේ අවස්ථා හා තර්ජන දක්වා ඇතිනම් ලකුණු ලබාදෙන්න.)

**(නම් කිරීමට ලකුණු $1 \times 2$ = ලකුණු 02යි)**
**(විස්තර කිරීමට 1 බැගින් ලකුණු 02යි)**

(v) (අ) කිසියම් කර්මාන්තයක තරකාරීත්වය වර්ධනය වීම, අදාළ කර්මාන්තයේ නියුතු ව්‍යාපාර ආයතනයක නිෂ්පාදිත හා මිල සම්බන්ධ තීරණවලට බලපාන ආකාර දෙක බැගින් පැහැදිලි කරන්න.

නිෂ්පාදිත සම්බන්ධව

(1) ගුණත්වය වැඩි කිරීමට සිදුවීම.
(2) නවෝත්පාදන ඇති කිරීමට සිදුවීම.
(3) ප්‍රතිලාභ වැඩිකිරීමට සිදුවීම.
(4) නව උපාංග එකතු කිරීමට සිදුවීම.
(5) අඛණ්ඩව සංවර්ධනය කළයුතු වීම.
(6) ප්‍රමිතීන් ස්ථාපිත කිරීමට සිදුවීම.

**(නම් කිරීම $\frac{1}{2} \times 2$ = ලකුණු 01යි)**
**(විස්තර කිරීම $\frac{1}{2} \times 2$ = ලකුණු 01යි)**

මිල සම්බන්ධව

(1) මිලෙහි වෙනස්කම් කිරීමට සිදුවීම.
(2) වට්ටම් හා දීමනා ලබා දීමට සිදුවීම.
(3) පහසු ගෙවීමේ ක්‍රම හඳුන්වාදීමට සිදුවීම.

**(නම් කිරීම $\frac{1}{2} \times 2$ = ලකුණු 01යි)**
**(විස්තර කිරීම $\frac{1}{2} \times 2$ = ලකුණු 01යි)**

## 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

1 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




II ප්‍රශ්න පත්‍රයෙහි I කොටසින් වැඩිම සිසුන් පිරිසක් තෝරාගත් ප්‍රශ්නය මෙයයි. එය තෝරාගෙන ඇති පිරිස 100%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 13%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 14%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබාගත් පිරිස 54%කි.

1 ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව




1 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්

මෙම ප්‍රශ්නයට අයත් කොටස් සහ අනුකොටස් 08 අතුරෙන් පහසුතාව වැඩිම අනුකොටස (i) (අ) වන අතර එහි පහසුතාව 80%කි. එසේම පහසුතාව අඩුම අනුකොටස වන්නේ (ii) (ආ) වන අතර එහි පහසුතාව 39%ක් බවත් සෙසු කොටස් හා අනුකොටස්වල පහසුතාව පිළිබඳවත් මෙම ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ.

පළමුවන ප්‍රශ්නයේ (ii) (ආ) අනුකොටසෙහි පහසුතාව 39%කි. මෙසේ පහසුතාව පහළ යාමට හේතුව වන්නේ පාරිභෝගික භාණ්ඩ වර්ග කිරීම මතකයෙන් සඳහන් කළත්, අවබෝධය නොමැති නිසා වර්ග කිරීමට අදාළව හේතු ලිවීමට අපේක්ෂකයන්ට නොහැකි වී ඇති නිසා ය. පාරිභෝගික භාණ්ඩ වර්ගීකරණයේ දී සැලකිල්ලට ගන්නා සාධක හා ඒවායේ ගති ලක්ෂණ පිළිබඳව නිදසුන් තුළින් මනාව ආවරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට ඇතුළත් කිරීම සුදුසු ය.

පළමුවන ප්‍රශ්නයේ (v) කොටසෙහි පහසුතාව 45%කි. එවැනි මට්ටමකට හේතුව ප්‍රශ්නයේ අන්තර්ගතය නිශ්චිතව හඳුනා නොගෙන පිළිතුරු සැපයීමයි. ව්‍යාපාර අතර තරගකාරීත්වය වර්ධනය වීම නිසා එවැනි ආයතන විසින් තම නිෂ්පාදිත හා මිල සම්බන්ධයෙන් ගත යුතු තීරණවලට බලපාන ආකාරයත් වෙන වෙනම පැහැදිලි වන සේ පංතිකාමරය තුළ දී විවිධ ක්‍රියාකාරකම් සිදු කිරීම යෝග්‍ය වේ.

**2 ප්‍රශ්නය**

(i) (අ) විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට රජයකට අනුගමනය කළ හැකි උපායමාර්ග **හතරක්** සඳහන් කරන්න.

(1) නීතිරීති ලිහිල් කිරීම.
(2) විනිමය ප්‍රතිපත්ති ලිහිල් කිරීම.
(3) යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
(4) නිදහස් වෙළෙඳ කලාප ඇති කිරීම.
(5) බදු සහන හා බදු විරාම ලබා දීම.
(6) විදේශීය ආයෝජන ප්‍රවර්ධනය.
(7) මධ්‍යස්ථ ජාත්‍යන්තර ප්‍රතිපත්ති මගින් ජාත්‍යන්තර සම්බන්ධතා ඇති කර ගැනීම.
(8) ආයෝජන හා වෙළෙඳ ගිවිසුම් ඇති කිරීම.

**(½ × 4 = ලකුණු 02යි)**

(ආ) පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම රජයක අරමුණකි. ඔබ, බෝතල් කළ පානීය ජලය නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයක නියුතු වී සිටින්නෙකු නම්, මෙම අරමුණ ඉටුකරලීමට ව්‍යාපාරිකයකු ලෙස ඔබට දායක විය හැකි ආකාර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(1) පානීය ජල බෝතල් නිෂ්පාදනයට අදාළ ප්‍රමිති සහතික ලබා ගැනීම හා පවත්වාගෙන යාම.
(2) ව්‍යාජ අනුකරණ වැළැක්විය හැකි සේ බෝතලය නිර්මාණය කිරීම.
(3) ආරක්ෂා සහිතව ප්‍රවාහනයට හා ගබඩා කිරීමට මෙන්ම පරිහරණය සඳහා අවශ්‍ය උපදෙස් අතරමැදියන්ට ලබා දීම.
(4) ජලය ලබා ගන්නා ජල මූලාශ්‍රය ආශ්‍රිතව පිරිසිදු බව හා වනගහනය ආරක්ෂා කර ගැනීම.
(5) පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ සේවකයින් දැනුවත් කිරීම.

**(කරුණු සහිතව පැහැදිලි කිරීමට 01 × 2 = ලකුණු 02යි)**

(ii) (අ) ආදායම් බදු හා එකතු කළ අගය මත බදු (VAT) සංසන්දනය කරමින් ඒවා අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න.

| ආදායම් බදු | එකතු කළ අගය මත බදු |
|---|---|
| • ඍජු බද්දකි/ විතැන් කළ නොහැකිය. | • වක්‍ර බද්දකි/ විතැන් කළ හැකිය. |
| • ආදායම මත බදු අය කෙරේ. | • භාණ්ඩ හා සේවා වටිනාකම මත අය කෙරේ. |
| • අනුක්‍රමික බද්දකි. | • නිශ්චිත බදු අනුපාතයකි. |
| • බදු ගණනයේ දී සමහර වියදම් අඩු කළ හැක. | • ගෙවූ බදු ආපසු ලබා ගත හැක. |

**(ලකුණු 01× 2 = ලකුණු 02යි)**

(ආ) බැංකු ණය පොලී අනුපාතය වැඩි කිරීම, දේපල වෙළෙඳාම (Real estate) ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාරිකයකුට බලපාන ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(1) විකුණුම් පහත වැටීම.
(2) ප්‍රාග්ධන පිරිවැය ඉහළ යාම.
(3) ව්‍යාපාරයේ ක්‍රියාකාරී පිරිවැය ඉහළ යාම.
(4) ආයෝජන හා වෙළෙඳ ගිවිසුම් ඇති කිරීම.
(5) ලාභාන්තිකය අඩු වීම. **(ලකුණු 01× 2 = ලකුණු 02යි)**

(iii) "රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර ආයතන වර්ග අතුරෙන් රාජ්‍ය සමාගම්, රාජ්‍ය සංස්ථාවලට වඩා ව්‍යාපාර තරගකාරීත්වයට මුහුණ දීමට යෝග්‍ය වේ." මෙම ප්‍රකාශය තහවුරු කිරීමට කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(1) මූල්‍ය නිදහස.
(2) තීරණ ගැනීමේ නිදහස.
(3) රාජ්‍ය අංශයේ මූල්‍ය රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලින් නිදහස් වීම.
(4) සේවක ප්‍රතිලාභ නම්‍යශීලීව ලබාදිය හැකි වීම.
(5) දේශපාලන බලපෑම් අවම වීම. **(නම් කිරීම 1× 2 = ලකුණු 02යි)**

**(විස්තර කිරීම 1× 2 = ලකුණු 02යි)**

(iv) (අ) ශ්‍රී ලංකාවේ 'සමූපකාර ව්‍යාපාරය' ක්‍රියාත්මක වන ආකාරය අනුව එහි හඳුනාගත හැකි ගැටළු **දෙකක්** සඳහන් කරන්න.

(1) කළමනාකරණ දුර්වලතා ඇති වීම.
(2) ස්වාධීනත්වය පිරිහීම හා දේශපාලනීකරණය වීම.
(3) සුදුසුකම් නොමැති පුද්ගලයින් කළමණාකරණයට පත්වීම.
(4) සාමාජික ප්‍රමාණය අඩුවීම.
(5) ප්‍රාග්ධන සම්පාදනය අඩු වීම.
(6) නිලධාරී පාලනයට යටත් වීම. **(1× 2 = ලකුණු 02)**

(ආ) වරලත් හිමියෙකු විසින් වරලත්ලාභියකු තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු **හතරක්** ලියන්න.

(1) වරලත්ලාභියා පිළිබඳව ඇති විශ්වාසවන්ත බව
(2) වරලත්ලාභියාගේ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම හා පලපුරුද්ද
(3) මූල්‍ය සහ වෙනත් ශක්තීන්
(4) වරලත්ලාභියාගේ ප්‍රතිරූපය හා කීර්තිනාමය **(½ × 4 = ලකුණු 02)**

(v) සනත් සහ පියල් යන දෙදෙනා ලිඛිත ගිවිසුමකින් තොරව රු. 100 000 බැගින් යොදා, ඖෂධ අලෙවි කිරීම සඳහා 'XY සහ සමාගම' නමින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. දී ඇති තොරතුරු පදනම් කරගෙන, ආරම්භ කිරීමට යන මෙම හවුල් ව්‍යාපාරයට අදාළ මූලික නෛතික පනත් හතරක් සඳහන් කර, ඒවා අදාළ වන්නේ කෙසේ දැයි කෙටියෙන් විස්තර කරන්න.

(1) 1890 හවුල් ආඥා පනත ලිඛිතව හවුල් ඔප්පුවක් නොමැතිව හවුල් ව්‍යාපාරයක් පවත්වගෙන යයි නම් හවුල් ව්‍යාපාර කටයුතු කළ යුතු ආකාරය මෙම පනතේ 24 වන වගන්තියේ දැක්වේ.

(2) 1840 අංක 07 දරණ වංචා වැළැක්වීමේ ආඥාපනත ආරම්භක ප්‍රාග්ධනය රු. 1000ට වඩා වැඩිනම් ලිඛිත හවුල් ගිවිසුමක් පවත්වා ගත යුතු බව මෙහි දැක්වේ.

(3) 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥා පනත හවුල්කරුවන්ගේ නම්වලින් හැර වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යයි නම් එම නාමය මේ පනත වටතේ ලියාපදිංචි කළ යුතු වේ.

(4) 2015 අංක 05 ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත (N. M. R. A) - / 1980 අංක 27 විලවුන් උපකරණ හා ඖෂධ පනත - ඖෂධ අලෙවිසැල පවත්වාගෙන යාම සඳහා **(නම් කිරීම ලකුණු ½ × 4 = ලකුණු 02)**

**(විස්තර කිරීම ලකුණු ½ × 4 = ලකුණු 02)**

## 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




2 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 76%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 43%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 08%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 37%කි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් සහ අනුකොටස් 08 අතුරෙන් පහසුතාවය වැඩිම අනුකොටස (i) (ආ) වන අතර එහි පහසුතාව 78%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නේ (iii) කොටස වන අතර එහි පහසුතාව 20%කි. සෙසු කොටස් හා අනුකොටස්වල පහසුතාවය පිළිබඳව මෙම ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ.

දෙවන ප්‍රශ්නයේ (iii) කොටසෙහි පහසුතාව 20%කි. මෙසේ පහසුතාව පහළ යාමට හේතුව, රාජ්‍ය සංස්ථාවලට වඩා රාජ්‍ය සමාගම් ව්‍යාපාර තරගකාරිත්වයට මුහුණ දීමට යෝග්‍ය වන බවට ප්‍රමාණවත් කරුණු තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමයි. රාජ්‍ය සංස්ථා හා රාජ්‍ය සමාගම්වලට අයත් සමානකම්, අසමානකම් පිළිබඳව අපේක්ෂකයින් තුළ මනා දැනුවත්භාවයක් ඇති කිරීමට විවිධ තොරතුරු මූලාශ්‍ර (උදා :- අන්තර්ජාලය) පරිහරණය කිරීමට ඔවුන් පෙළඹවීම සුදුසු ය. එමෙන් ම පිළිතුරු සැපයීමේ දී ප්‍රශ්නයට අදාළව කරුණු දැක්වීමට අපේක්ෂකයන් හුරු කළ යුතු ය.

දෙවන ප්‍රශ්නයේ (iv) (අ) අනුකොටසෙහි පහසුතාව 39%කි. මෙසේ පහසුතාව අඩුවීමට හේතුව සමූපකාරය හා සමූපකාර ව්‍යාපාරයේ වෙනස නිශ්චිතව හඳුනා නොගැනීමයි. සියවසකට වඩා පැරණි ව්‍යාපාර සංවිධානයක් වන සමූපකාර ව්‍යාපාරය වර්ධනය නොවීමට හේතු වී ඇති කරුණු පිළිබඳව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සොයා බැලීමට අපේක්ෂකයන් දැනුවත් කිරීම යෝග්‍ය වේ.

දෙවන ප්‍රශ්නයේ (v) කොටසෙහි පහසුතාව 35%කි. මෙසේ පහසුතාව අඩුවීමට හේතු වී ඇත්තේ හවුල් ව්‍යාපාරවලට බලපාන නීතිමය අණපනත් දැක්වීමේ දී වර්ෂය සහ අංක සහිතව පනත් ඉදිරිපත් කිරීමට සිසුන් තුළ නිවැරදි අවබෝධයක් නොතිබීම ය. විෂය ඒකක හා සම්බන්ධව අණපනත් සඳහන් කිරීමේ දී නිශ්චිතව ම අදාළ පනතේ නම, වර්ෂය හා අංකය නිවැරදිව සඳහන් කිරීමට අපේක්ෂකයන් හට උපදෙස් ලබා දීම වඩාත් යෝග්‍ය වේ.

**3 ප්‍රශ්නය**

(i) "රටක සංවර්ධනයට වඩාත් අවශ්‍ය වන්නේ ව්‍යාපාරිකයන්ට වඩා ව්‍යවසායකයින් ය." මෙම ප්‍රකාශය, ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා සංසන්දනය කරමින් පැහැදිලි කරන්න.

| ව්‍යාපාරිකයා | ව්‍යවසායකයා |
|---|---|
| 1. සාම්ප්‍රදායකයි.<br>2. තිබෙන දෙයින් සෑහීමකට පත්වේ.<br>3. අවදානම මගහරී.<br>4. සාම්ප්‍රදායික තීරණ.<br>5. කෙටිකාලීන ඉලක්ක.<br>6. තරගයට කැමති නැත.<br>7. පවතින දැනුම මත යැපේ. | 1. වෙනස්වීම් වලට නැඹුරුය.<br>2. නිර්මාණශීලීව අවස්ථා හඹායයි.<br>3. අවදානම භාරගනී.<br>4. නිර්මාණශීලී තීරණ.<br>5. දිගුකාලීන ඉලක්ක.<br>6. තරගයට කැමතිය.<br>7. අඛණ්ඩව දැනුම සොයා යයි. |

වර්තමාන ව්‍යාපාර පරිසරය ගතික, තරගකාරී සහ දැඩි ලෙස විචලනය වන මෙන් ම ගෝලීයකරණය වූ බැවින් එවැනි පරිසරයක් තුළ ක්‍රියාත්මක වී රටක සංවර්ධනයට දායක වීමට ව්‍යාපාරික ලක්ෂණවලට වඩා ව්‍යවසාය ලක්ෂණ වැදගත් වන බව පැහැදිලි කළ යුතු ය.

**(වෙනස්කම් 1ට ලකුණු 1 බැගින් 3කට ලකුණු 03)**

**නිගමනය පැහැදිලි කිරීමට ලකුණු 01)**

(ii) අමල් කුඩා කළ සිටම ව්‍යවසායකයකු වීමේ අදහසින් සිටි අයෙකි. නමුත් මූල්‍යමය වශයෙන් ශක්තිමත් නොවූ නිසා ඔහු සුළු ප්‍රාග්ධනයකින් ආරම්භ කළ හැකි, අර්ධ අගනා මැණික් ගල් භාවිත කර විසිතුරු භාණ්ඩ නිපදවීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේය. එය මේ වන විට දියුණු තත්ත්වයකට පත් වෙමින් තිබේ. මෙම සිද්ධියට අනුව ව්‍යවසායකගති ලක්ෂණ **දෙකක්** හේතු සහිතව විස්තර කරන්න.

(1) අධිෂ්ඨානශීලී බව - කුඩාකල සිටම පැවති අදහස මුදුන්පත් කරගත් හෙයින්.
(2) නිර්මාණශීලී බව - නව දේ කිරීමට සිතීම.
(3) ආත්ම විශ්වාසය - ව්‍යාපාරයක් කළ හැකි බව විශ්වාස කිරීම.
(4) කැපවීම හා උනන්දුව - ව්‍යාපාරය සාර්ථක කර ගැනීම.
(5) අවස්ථාව හඳුනාගැනීම සහ ක්‍රියාවට නැංවීම - තම ප්‍රදේශයේ ඇති සම්පත් ප්‍රයෝජනයට ගැනීම/ සුළු ප්‍රාග්ධනයකින් ආරම්භ කළ හැකි වීම.
(6) නොනැවතී කරගෙන යාම - ව්‍යාපාරය ආරම්භ කර දියුණුවට පත්කර ගැනීම.

**(සිද්ධිය තුළින් කරුණු හඳුනාගැනීමට එක් කරුණකට ලකුණු 01 බැගින් 2කට ලකුණු 02)**

**(පැහැදිලි කිරීමකට ලකුණු 01 බැගින් 2කට ලකුණු 02)**

(iii) (අ) චෙක්පතක් රේඛනය කිරීම තුළින් අණකරුවකු ඉටුකර ගැනීමට අපේක්ෂා කරන අරමුණු **දෙකක්** සඳහන් කරන්න.

(1) ආරක්ෂාව/ කවුන්ටරයෙන් මුදල් ලබා ගැනීම වැළැක්වීම.
(2) චෙක්පතට මුදල් ලබා ගන්නා පුද්ගලයා කවුරුන්දැයි හඳුනාගත හැකි ය.
(3) ආදායකයාගේ ගිණුමට පමණක් යයි සඳහන් කරමින් රේඛනය කර ඇත්නම් චෙක්පත හුවමාරුව සීමා කිරීම.
(4) ලිඛිත සාක්ෂියක් ලෙස තබා ගැනීම.

**(ලකුණු $1\times 2$ = ලකුණු 02)**

(ආ) සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල අතර වෙනස්කම් **දෙකක්** ලියන්න.

| සේවක අර්ථසාධක අරමුදල | සේවක භාරකාර අරමුදල |
|---|---|
| 1. සේවක සේව්‍ය යන පාර්ශව දෙකම දායක වේ. | සේව්‍යයා පමණක් දායක වේ. |
| 2. විදේශ හා ස්වයං රැකියා නියුක්තිකයන්ට සාමාජිකත්වය ලබාගත නොහැක. | විදේශ හා ස්වයං රැකියා නියුක්තිකයන්ටද සාමාජිකත්වය ලබාගත හැක. |
| 3. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වාගෙන යයි. | භාරකාරත්ව මණ්ඩලයෙන් මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යයි. |
| 4. කාන්තාවන් විවාහය මත රැකියාවෙන් ඉවත්වීම, විශ්‍රාමයාම, රට හැරයාම, විශ්‍රාම වැටුප් සහිත රැකියාවකට යාම යන කරුණු මත අරමුදල් ආපසු ලබාගත හැකිය. | රැකියාවෙන් ඉවත් වූ විට අරමුදලේ මුදල් ආපසු ලබාගත හැකිය. (අවුරුදු 05ක කොන්දේසියට යටත්ව) |
| 5. පොලියට අමතරව සීමිත ප්‍රතිලාභ | පොලියට අමතර වැඩි ප්‍රතිලාභ |

**(ලකුණු 1× 2 = ලකුණු 02)**

(iv) ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්ථාව (2016) ට අනුව ණය කාඩ්පත් භාවිතය රටෙහි මුළු ජනගහනයෙන් 6%කට ආසන්න ප්‍රමාණයකි.

(අ) ශ්‍රී ලංකාවේ ණය කාඩ්පත් භාවිතය අඩු මට්ටමක පැවතීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(1) ණය ගැතියෙකු වීමට ඇති අකමැත්ත.
(2) ගනුදෙනුවල විශ්වාසභාවය අඩුවීම.
(3) දැනුවත්බව අඩුවීම.
(4) භාවිත කිරීමට අවශ්‍ය පහසුකම් රට පුරා ඒකාකාරීව ව්‍යාප්ත නොවීම.
(5) ණය කාඩ්පත් ලබාගැනීමට සුදුසුකම් ලබා ගැනීමේ බැංකු කොන්දේසි.
(6) ඉහළ පොලියක් අයකිරීම. (නියමිත කාලය ඉක්මවීම)

**(ලකුණු 1× 2 = ලකුණු 02)**

(ආ) ණය කාඩ්පත් භාවිතය වැඩිකිරීමට බැංකුකරුවකුට අනුගමනය කළ හැකි උපායමාර්ග සඳහන් කරන්න.

(1) දැනුවත්බව වැඩි කිරීම.
(2) ව්‍යාපාරික ආයතන සමඟ ගිවිසුම්ගත වීම හා ජාල සම්බන්ධතා ඇතිකර ගැනීම.
(3) ආකර්ශනීය දිරිගැන්වීම් ලබාදීම.
(4) වංචා වැළැක්වීම සඳහා ආරක්ෂිත ක්‍රම හඳුන්වාදීම.
(5) විවිධ පාරිභෝගික ඛණ්ඩනවලට ගැළපෙන පරිදි කාඩ්පත් විවිධාංගීකරණය.

**(ලකුණු ½ × 4 = ලකුණු 02)**

(v) (අ) රටක විදේශ විනිමය ප්‍රතිපත්තිය ලිහිල් කිරීම එම රටෙහි විදේශ වෙළෙඳාමේ නියුතු ව්‍යාපාරවලට බලපාන ආකාර **දෙකක්** ලියන්න.

(1) විදේශ මුදල් සංක්‍රමණය පහසුවීම.
(2) විදේශ වෙළෙඳ කටයුතු පහසුවීම.
(3) විදේශ ව්‍යාපාරිකයින් සමග සාමූහික වෙළෙඳ ගිවිසුම් ඇතිකර ගැනීම පහසුවීම.
(4) නව ව්‍යාපාර පැමිණීම නිසා ජාත්‍යන්තර තරගකාරීත්වය වැඩිවීම.

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවල අධීක්ෂණ කටයුතු කිරීම, ගනුදෙනුකරුවන්ට හිතකර ලෙස බලපාන ආකාර **දෙකක්** පැහැදිලි කරන්න.

(1) තැන්පතුවල සුරක්ෂිතභාවය ඉහළ යාම.
(2) තැන්පතු සඳහා ප්‍රතිලාභ තහවුරුවීම.
(3) ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ඉහළ යාම.
(4) ආයෝජන හා ඉතිරිකිරීම් සඳහා විකල්ප අවස්ථා හිමි වීම.

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

## 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




3 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 80%කි. (ප්‍රස්තාරය 2)
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 11%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 37%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 41%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 52%කි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් සහ අනුකොටස් 08 අතුරෙන් පහසුතාවය වැඩිම කොටස (iv) (අ) වන අතර එහි පහසුතාව 81%කි. එසේම පහසුතාව අඩුම කොටස (iii) (ආ) වන අතර එහි පහසුතාව 28%කි. සෙසු ප්‍රශ්නවල පහසුතාවය පිළිබඳව මෙම ප්‍රස්තාරයෙන් පැහැදිලි වේ.

තුන්වන ප්‍රශ්නයෙහි (iii) (ආ) අනුකොටසෙහි පහසුතාව 28%කි. මෙසේ පහසුතාව අඩුවීමට හේතුව සේවක අර්ථසාධක අරමුදල (E.P.F) හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (E.T.F) අතර මූලික වෙනස්කම් පිළිබඳ අවබෝධයක් අපේක්ෂකයන්ට නොතිබීමයි. එම නිසා එම අරමුදල් හා සම්බන්ධ වන ලක්ෂණ පිළිබඳව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

එමෙන්ම (v) (අ) අනුකොටසේ පහසුතාව 31%කි. එවැනි අඩු මට්ටමක පහසුතාවක් ලැබීමට හේතුව වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන වල අධීක්ෂණ කටයුතු ගනුදෙනුකරුවන්ට හිතකර වන ආකාරය පිළිබඳව අපේක්ෂකයන් දැනුවත් නොවීමයි. එබැවින් මහ බැංකුවේ අධීක්ෂණ කටයුතු අතරින් ගනුදෙනුකරුවන්ට හිතකර ආකාරය තහවුරු වන අභ්‍යාසවල අපේක්ෂකයින් නිරත කරවීම සුදුසු ය.

**4 ප්‍රශ්නය**

(i) (අ) පියසිරි විසින් දරුකමට හදාගනු ලැබූ වසන්ත වෙනුවෙන් ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන තිබුණි. එහෙත් ළමා කාලයේ සිට පැවති රෝගයකින් වයස අවුරුදු 26 දී වසන්ත මිය ගියේ ය. පියසිරි විසින් වසන්තගේ ජීවිත රක්ෂණ ඔප්පුවට වන්දි ලබා ගැනීමට යෑමේ දී ඇතිවිය හැකි ගැටළු **දෙකක්** රක්ෂණ මූලධර්ම පදනම් කරගෙන කෙටියෙන් පැහැදිලි කරන්න.

(1) රක්ෂණ හිමිකම - නීත්‍යානුකූලව පැවරූ ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතු වීම.
(2) උපරිම විශ්වාසය - රක්ෂණ ඔප්පුවට අදාළ සියළුම තොරතුරු නොසඟවා ඉදිරිපත් කළ යුතු වීම.

**(මූලධර්ම දැක්වීමට ලකුණු ½ × 2 = ලකුණු 01)**
**(පැහැදිලි කිරීමට ලකුණු ½ × 2 = ලකුණු 01)**

(ආ) 'මහජන වගකීම් රක්ෂණය' යනු කුමක් දැයි විස්තර කර ඊට නිදසුනක් සපයන්න.

ව්‍යාපාර කටයුතු හේතුවෙන් මහජනයාට සිදුවිය හැකි හානි, අනතුරු විපත් ආවරණය කිරීම සඳහා ලබා ගන්නා රක්ෂණය යි.

උදා ඃ- ආහාරපාන විෂවීම සම්බන්ධ ආදී **(විස්තර කිරීමට ලකුණු 01)**
**(නිදසුනට ලකුණු 01)**

(ii) (අ) ආයතනයක් විසින් සන්නිවේදන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.

(1) පිරිවැය
(2) ආවරණය
(3) පණිවුඩයට ගැලපීම
(4) තරගකරුවන් භාවිතා කරන මාධ්‍යයන්
(5) සන්නිවේදනය කළයුතු ග්‍රාහක පිරිස
(6) භාවිතයේ පහසුව
(7) වේගය
(8) විශ්වාසවන්ත බව **(ලකුණු ½ × 4 = ලකුණු 02)**

(ආ) ගෝලීය තැන් සෙවුම් පද්ධතිය (Global Positioning System - GPS) භාවිතා කිරීම මඟින් භාණ්ඩ ප්‍රවාහනයේ දී ව්‍යාපාරිකයෙකුට ඇති වන වාසි **දෙකක්** දක්වන්න.

(1) ළඟාවිය හැකි කෙටිම මාර්ගය හඳුනා ගත හැකිවීම.
(2) අදාළ දුර ප්‍රමාණය දැනගත හැකි වීම.
(3) පිරිවැය තීරණය කළ හැකි වීම.
(4) අදාළ ස්ථානයන්හි පිහිටීම පිළිබඳව අවබෝධයක් ලැබීම.
(5) තම ආයතනයේ වාහන ධාවනයේ දී දැනට තිබෙන ස්ථානය පිළිබඳව දැනගත හැකි වීම.

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

(iii) සිල්ලර වෙළෙඳ ක්ෂේත්‍රය තුළ සුපිරි වෙළෙඳසැල් ක්‍රමය ජනප්‍රිය වුව ද සාම්ප්‍රදායික සිල්ලර අලෙවිසැල් ද බහුලව පැවතීමට බලපාන හේතු **හතරක්** සඳහන් කරන්න.

(1) ණයට භාණ්ඩ ලබාගත හැකිවීම.
(2) පහසුවෙන් ළඟාවිය හැකිවීම.
(3) ඉතා කුඩා ප්‍රමාණයන්ගෙන් භාණ්ඩ ලබාගත හැකිවීම.

(4) අවශ්‍ය වේලාවට ළඟාවිය හැකිවීම.
(5) භාණ්ඩ මිල කේවල් කළ හැකි වීම.
(6) සිල්ලර වෙළෙඳසැල් ද නව තාක්ෂණය ආදේශනය කර තිබීම.
(7) පෞද්ගලික සම්බන්ධතා (ගනුදෙනුකරු හා වෙළෙන්දා අතර)
(8) පාරිභෝගික විශ්වාසය
(9) නැවුම් භාණ්ඩ මිලදී ගත හැකිවීම.
(10)සිල්ලර වෙළෙඳසැල් නව අලෙවිකරණ හා ප්‍රවර්ධන ක්‍රම අනුගමනය කිරීම.

**(ලකුණු $1 \times 4$ = ලකුණු 04)**

(iv)(අ) "භාණ්ඩ බෙදාහැරීමේ ක්‍රියාවලියේ දී තොග වෙළෙන්දා අත්‍යවශ්‍ය පාර්ශ්වකරුවෙකි." මෙම අදහස පක්ෂව හා විපක්ෂව කරුණු **දෙක** බැගින් සඳහන් කරන්න.

පක්ෂව - 1. භාණ්ඩ බෙදා හැරීම පහසුවීම.
2. භාණ්ඩ හඳුන්වා දීම පහසුවීම.
3. නිෂ්පාදකයන්ගේ කාර්යයන් පහසුවීම.
4. වෙළෙඳපොල තොරතුරු අදාළ පාර්ශ්වයන්ගෙන් ලබාගත හැකිවීම.
5. සිල්ලර වෙළෙන්දාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා අඩුකරගත හැකි වීම.

විපක්ෂව -1. වෙළෙඳපොලේ අනවශ්‍ය භාණ්ඩ හිඟයක් ඇති වීම.
2. සමහර විට භාණ්ඩවල නියම ගුණත්වය ආරක්ෂා නොවීම.
3. භාණ්ඩවල මිල ගණන් ඉහළ යා හැකි වීම.
4. කොන්දේසිවලට යටත් වීමට සිදු වීම.

**(පක්ෂව කරුණු දැක්වීමට ලකුණු $\frac{1}{2} \times 2$ = ලකුණු 01)**
**(විපක්ෂව කරුණු දැක්වීමට ලකුණු $\frac{1}{2} \times 2$ = ලකුණු 01)**

(ආ) 'පොදු වරණීය තීරුබදු සහනය + (Generalized System of Prefcrence - GSP+) යනුවෙන් කුමක් අදහස් වේද?

සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දෙනු ලබන තීරුබදු සහනයකි. GSP+ වලදී මූලික ප්‍රතිලාභවලට අමතර තවත් ව්‍යාප්ත වූ ක්ෂෙත්‍රවලට ප්‍රතිලාභ ලබා දේ.

**(ලකුණු = 02)**

(v)(අ) විද්‍යුත් වෙළෙඳාමක් සිදුවන ආකාරයට අයත් පියවර ලැයිස්තුගත කරන්න.
(1) අන්තර්ජාලය ඔස්සේ ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්මුඛ වීම.
(2) වෙළෙඳ ගනුදෙනුව සංවිධානය කර ගැනීම.
(3) භාණ්ඩ විකිණීමේ හා මිලට ගැනීමේ කටයුතු සිදු වීම.
(4) ගනුදෙනුවට අදාළ ගෙවීම් කටයුතු පියවීම.

**(ලකුණු $\frac{1}{2} \times 4$ = ලකුණු 02)**

(ආ) විද්‍යුත් ව්‍යාපාර (e - Business) ගනුදෙනු හා විද්‍යුත් වාණිජ්‍ය (e - Commerce) අතර වෙනස්කම් **දෙකක්** ලියන්න.

(1) විද්‍යුත් ව්‍යාපාර සඳහා සියළුම ව්‍යාපාර කටයුතු අයත් වුවත් විද්‍යුත් වාණිජ්‍යට අයත් වන්නේ මිලදී ගැනීම හා විකිණීම සම්බන්ධ ක්‍රියාකාරකම් පමණි.
(2) විද්‍යුත් ව්‍යාපාර පුළුල් සංකල්පයක් වන අතර විද්‍යුත් වාණිජ්‍ය ඉන් කොටසක් පමණි.
(3) විද්‍යුත් ව්‍යාපාර අභ්‍යන්තර නැඹුරුවක් ඇති අතර විද්‍යුත් වෙළෙඳාම බාහිර නැඹුරුවකි.

**(ලකුණු $1 \times 2$ = ලකුණු 02)**

## 4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




4 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 49%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ. II වන ප්‍රශ්න පත්‍රයෙහි I වන කොටසින් අවුම ප්‍රතිශතයක් තෝරාගෙන ඇත්තේ 4 වන ප්‍රශ්නයයි.

| | | |
|---|---|---|
| ඉන් ලකුණු | 00 - 05 ප්‍රාන්තරයේ | 23%ක් ද, |
| ලකුණු | 06 - 10 ප්‍රාන්තරයේ | 37%ක් ද, |
| ලකුණු | 11 - 15 ප්‍රාන්තරයේ | 28%ක් ද, |
| ලකුණු | 16 - 20 ප්‍රාන්තරයේ | 12%ක් ද, |

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 40%කි.

**4 ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව**




4 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්

මෙම ප්‍රශ්නයට අයත් කොටස් සහ අනුකොටස් 09 අතුරෙන් පහසුතාවය වැඩිම කොටස II (ආ) වන අතර එහි පහසුතාව 59%කි. එසේම පහසුතාව අඩුම කොටස් වන්නේ (IV) (ආ) හා (V) (අ) හා (ආ)යන කොටස් ය. එහි පහසුතා පිළිවෙලින් 31%, 33% හා 31% වේ.

හතරවන ප්‍රශ්නයේ (iv) (ආ) අනුකොටසෙහි පහසුතාව 31%ක් වන අතර මෙසේ පහසුතාව අඩුවීමට හේතුව පොදු වරණීය තීරුබදු සහනය (G.S.P +) පිළිබඳ අවබෝධයක් අපේක්ෂකයින්ට නොතිබීමයි. අන්තර්ජාතික වෙළෙඳාමෙහි භාවිත වන ගිවිසුම් හා නව ප්‍රවණතා පිළිබඳව අපේක්ෂකයින් තුළ දැනුම හා අවබෝධය පුළුල් වන සේ පන්ති කාමරය තුළ දී විවිධ ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීම සුදුසු වේ.

හතරවන ප්‍රශ්නයේ (v) (අ) අනුකොටසෙහි පහසුතාව 33%කි. මෙසේ අඩු පහසුතාවයක් ඇති වීමට හේතු වී ඇත්තේ විද්‍යුත් වෙළෙඳාමක් සිදුවන ආකාරය මෙන් ම ඒවා අනුපිළිවෙලින් ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වීමය. එම නිසා මේ පිළිබඳව න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව කරුණු සොයා බැලීමට අපේක්ෂකයින් පුරුදු පුහුණු කළ යුතු යි.

හතරවන ප්‍රශ්නයේ (v) (ආ) අනුකොටසෙහි පහසුතාව 31%කි. මෙසේ අඩු පහසුතාවයක් ඇති වීමට හේතු වී ඇත්තේ විද්‍යුත් ව්‍යාපාර හා විද්‍යුත් වාණිජ්‍ය පිළිබඳව වෙනස්කම් සන්සන්දනාත්මකව ඉදිරිපත් කිරීමට නොහැකි වීමයි. විද්‍යුත් ව්‍යාපාර හා විද්‍යුත් වාණිජ්‍යය අතර සවිස්තරාත්මක ව වෙනස්කම් පිළිබඳව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අවධානය යොමු කළ යුතු ය.

## II කොටස

**5 ප්‍රශ්නය**

(i) (අ) "නිවැරදි දෙයක් නිවැරදි ආකාරයට කිරීම" කළමනාකරණය ලෙස පීටර් ඩ්‍රකර් විසින් දක්වා ඇත. මෙම අදහසෙහි අඩංගු කළමනාකරණ මූලිකාංග **දෙක** සඳහන් කරන්න.

(1) කාර්යක්ෂමතාව
(2) සඵලදායකත්වය **(ලකුණු 1 × 2 = ලකුණු 02)**

(ආ) හෙන්රි මින්ට්ස්බර්ග් විසින් විස්තර කළ, කළමනාකරුවකුගේ තීරණ ගැනීමේ භූමිකාවට අයත් උප භූමිකා **හතර** නම් කරන්න.

(1) ව්‍යවසායකයා
(2) බාධා පාලනය කරන්නා
(3) සම්පත් වෙන් කර දෙන්නා
(4) අදහස් හුවමාරු කරන්නා/ කතිකා කරන්නා

**(ලකුණු ½ × 4 = ලකුණු 02)**

(ii) (අ) පාලන විතස්තිය (පාලන අවකාශය) තීරණය කිරීමට බලපාන කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(1) කාර්යයේ ස්වභාවය
(2) ප්‍රධානියාගේ කුසලතා
(3) යටත් සේවකයන්ගේ හැකියාව හා පලපුරුද්ද
(4) සංවිධානයේ බලගැන්වීමේ ප්‍රතිපත්ති

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

(ආ) ආයතනයක සංවිධාන සටහන පිරමීඩාකාර හැඩයක් ගැනීමෙන් විදහා දැක්වෙන කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(1) සංවිධානයේ ඉහළ මට්ටමේ කළමනාකරුවන් ප්‍රමාණයට වඩා පහළ මට්ටමේ කළමනාකරුවන් වැඩි සංඛ්‍යාවක් සිටින බව.
(2) විවිධ කළමනාකරණ මට්ටම ඇති බව.
(3) අධිකාරිය ධූරාවලියක් ලෙස පවතින බව.
(4) විවිධ මට්ටම්වල කළමනාකරුවන්ට විවිධ කුසලතා අවශ්‍ය වන බව.

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

(iii) ව්‍යාපාරික ආයතනයක අරමුණුවල (Objectives) මූලික ගුණාංග **හතරක්** කෙටියෙන් විස්තර කරන්න.

(1) Specific - නිශ්චිත වීම.
(2) Mesurable - මැනිය හැකි බව.
(3) Achievable/ Agreed - ළඟා විය හැකි බව.
(4) Realistic/ Relevent - යථාර්තවාදී බව / අදාළ බව.
(5) Time bond - නිශ්චිත කාලයක් සහිත වීම.

**(නම් කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02)**
**(විස්තර කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02)**

(iv) (අ) තාර්කික තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පියවර මොනවා ද?

(1) ගැටළුව හඳුනා ගැනීම.
(2) විකල්ප විසඳුම් ගොඩ නැගීම.
(3) විකල්ප ඇගයීම.
(4) හොඳම විකල්පය තේරීම.
(5) ක්‍රියාත්මක කිරීම. **(අනුපිළිවෙලින් පියවර 5 ම දැක්වීමට ලකුණු 02)**

**(අනුපිළිවෙලින් පියවර 4 ක් දැක්වීමට ලකුණු 01)**

**(එසේ නැතිනම් ලකුණු නැත.)**

(ආ) මෙහෙවර ප්‍රකාශයක අන්තර්ගත විය යුතු මූලිකාංග **දෙකක්** සඳහන් කරන්න.

(1) ගනුදෙනුකරුවන්
(2) නිෂ්පාදිතයේ ස්වභාවය/ ව්‍යාපාරයේ ස්වභාවය
(3) වෙළෙඳපොල
(4) ස්ව සංකල්පය
(5) අගනාකම්, විශ්වාස හා දර්ශනය
(6) රඳා පැවැත්ම හා වර්ධනය
(7) මහජන ප්‍රතිරූපය
(8) තාක්ෂණය
(9) සේවකයන්

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

(v) (අ) සැලසුම්කරණ ක්‍රියාවලියේ දී දැකිය හැකි ප්‍රයෝගික ගැටළු **හතරක්** ලියන්න

(1) කාලීන හා නිවැරදි තොරතුරු යොදා නොගැනීම.
(2) පසුගිය උපනතීන් හා පවත්නා දත්ත මත සැලසුම් සකස් කිරීම.
(3) හැකියාව හා ධාරිතාව ඉක්මවා සැලසුම් සකස් කිරීම.
(4) උනන්දුව හා කැපවීම ප්‍රමාණවත් නොවීම.
(5) ආයතනයේ සෑම මට්ටමකම සේවකයන්ගේ සම්බන්ධය හා සහයෝගය නොලැබීම.
(6) සමස්ථ කළමණාකරණ පද්ධතියට සැලසුම් සමෝධානික නොවීම.
(7) සැලසුම බලාපොරොත්තු ආකාරයෙන්ම ක්‍රියාත්මක වෙතැයි යන විශ්වාසය
(8) සැලසුම්කරණය පිළිබඳ ඇති විශ්වාසය අඩුවීම.
(9) සැලසුම් සකස්කිරීමේ දක්ෂතා ඇති අය අඩුකම. **(ලකුණු ½ × 4 = ලකුණු 02)**

(ආ) "සංවිධානයක ඉහළ මට්ටමේ කළමනාකරුවන්ට සෙසු කළමනාකරණ මට්ටම්වලට වඩා වැඩියෙන් සංකල්පනාත්මක කුසලතා තිබිය යුතු වේ." මෙම අදහසට පක්ෂව කරුණු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

සංකල්පනාත්මක කුසලතා යනු සමස්තය දැකීම හා සමෝධානය කිරීමේ හැකියාවයි.

**(නිර්වචනය අනිවාර්යය නොවේ.)**

(1) සංවිධානයක සාංගමික අරමුණු නියම කිරීමට.
(2) උපාය මාර්ග ප්‍රතිපත්ති තීරණය කිරීමට.
(3) පරිසර විචල්‍යතාවලට නිර්මාණශීලීව විසඳුම් සැපයීමට.
(4) සංවිධානයේ සියළු අංශ සමෝධානය කිරීමට.

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

## 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




5 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 64%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 38%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 07%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 36%ක් වන අතර අපේක්ෂකයින්ගෙන් 64%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් සහ අනුකොටස් 09 අතුරෙන් පහසුතාවය වැඩිම කොටස වන්නේ I (අ) කොටසයි. එහි පහසුතාව 73%කි. එසේම පහසුතාව අඩුම කොටස වන්නුයේ (II) (අ) වන අතර එහි පහසුතාවය 18% කි. සෙසු කොටස් වල පහසුතාවය ප්‍රස්තාරයෙන් දැක්වේ.

පස්වන ප්‍රශ්නයේ (ii) (අ) අනුකොටසෙහි පහසුතාව 18%කි. එවැනි ඉතා පහළ මට්ටමක් පැවතීමට හේතුව වූයේ පාලන අවකාශ තීරණය කිරීමට බලපාන කරුණු කෙරෙහි ප්‍රමාණවත් අවබෝධයක් නොතිබීමයි. එමෙන්ම අපේක්ෂකයින් තුළ විග්‍රහ කිරීමේ හැකියාව ද අඩු බවක් පෙනේ. එම නිසා පාලන අවකාශ මෙන්ම එම අවකාශයන් තීරණය කිරීමට බලපාන කරුණු කෙරෙහි ද අවබෝධය වැදගත්ය. ඒවා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට ඇතුලත් කර ගැනීම වඩාත් සුදුසු වේ.

පස්වන ප්‍රශ්නයේ (ii) (ආ) අනුකොටසෙහි පහසුතාව 34%කි. මෙවැනි අඩු මට්ටමක් ඇති වීමට හේතුව සංවිධාන සටහන් පිරමීඩාකාරයකින් ඉදිරිපත් කළද එවැනි පිරමීඩයක් ඇතිවීමට බලපාන හේතු කෙරෙහි අවධානය යොමු නොකිරීමයි. එබැවින් එවැනි සියුම් ක්ෂේත්‍ර කෙරෙහි ද අවධානය යොමු වන සේ පැවරුම් ලබා දීම යෝග්‍ය වේ.

පස්වන ප්‍රශ්නයේ (iv) (ආ) අනුකොටසෙහි පහසුතාව 21%කි. එවැනි ඉතා අඩු මට්ටමක පහසුතාවය පැවතීමට හේතු වූයේ මෙහෙවර ප්‍රකාශයක ඇතුළත් මූලිකාංග පිළිබඳ නිශ්චිත අවබෝධයක් නොමැති වීමයි. එම නිසා මෙහෙවර ප්‍රකාශ ගැඹුරින් අධ්‍යයනය කර ඒවා තුළ අන්තර්ගත වන මූලිකාංග නිශ්චිතව හඳුනා ගතහැකි අයුරින් හා මෙහෙවර ප්‍රකාශයන් සකස් කරවීමට පන්තිකාමරය තුළ දී ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කිරීම උචිත වේ.

6 ප්‍රශ්නය

(i) සංවිධානකරණයේ දී සිදුවිය හැකි දුර්වලතා හතරක් කෙටියෙන් විස්තර කරන්න.

(1) කාර්යයන් නිවැරදි ලෙස හඳුනා නොගැනීම.
(2) කාර්යයන් නිවැරදිව බෙදා නොහැරීම. (දුර්වල ශ්‍රම විභජනය)
(3) දෙපාර්තමේන්තුකරණය යෝග්‍ය ලෙස නොකිරීම.
(4) අධිකාරීත්වය ප්‍රමාණවත් ලෙස නොපැවරීම.
(5) සමායෝජනය නිවැරදිව සිදු නොකිරීම.
(6) අධිකාරිය හා වගකීම් සමාන නොවීම.
(7) අණකිරීමේ ධූරාවලියෙහි සංකීර්ණ බව.
(8) සම්පත් අවශ්‍යතාවය පරිදි බෙදා නොහැරීම
(9) පාලන විතස්ථිය (අවකාශය) යෝග්‍ය නොවීම.

**(විස්තර වන ආකාරයට කරුණු දැක්වීමට ලකුණු 1 × 4 = ලකුණු 04)**

(ii) නෛතික බලය හැර කළමනාකරුවකුට බලය ලැබෙන වෙනත් මූලාශ්‍ර හතරක් නම් කර, ඉන් **දෙකක්** විස්තර කරන්න.

(1) විශේෂඥ බලය
(2) අනුහස් බලය/ පෞරුෂත්වය (ගරුත්වයට ලක්වීමට ලැබෙන බලය)
(3) ත්‍යාග දීම සඳහා ඇති බලය
(4) දඬුවම් දීමට ඇති බලය
(5) තොරතුරු බලය

**(නම් කිරීමට ලකුණු ½ × 4 = ලකුණු 02)**

**(පැහැදිලි කිරීමට ලකුණු 1 × 2 = ලකුණු 02)**

(iii) (අ) ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව හා නිර්බාධවාදී නායකත්ව ශෛලීන් අතර සමානකම් **දෙකක්** ලියන්න.

(1) තීරණ ගැනීමේ දී සහායකයන්ගේ සහභාගිත්වය ලබාගනී.
(2) තීරණ ගැනීම සඳහා සහායකයින්ට නිදහස ලබාදේ.
(4) සහායකයින් පිළිබඳව විශ්වාස කිරීම.
(5) ත්‍යාග දීම/ ප්‍රතිලාභ ලබාදීම සම්බන්ධව වැඩි අවධානය.

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

(ආ) වැඩබිම් මට්ටමේ (Floor - level) සේවකයන් අභිප්‍රේරණය කිරීම සඳහා ව්‍යාපාරයකට යොදා ගත හැකි ක්‍රම **හතරක්** ලියන්න.

(1) වැඩි වැටුප් හා වේතන ගෙවීම.
(2) ප්‍රසාද දීමනා ලබාදීම.
(4) ණය පහසුකම් ලබා දීම.
(5) සෞඛ්‍ය පහසුකම්, නිවාස, ආහාරපාන, නිල ඇඳුම් වැනි සුබසාධන පහසුකම් සැපයීම.
(6) රැකියාවේ සුරක්ෂිත බව ආරක්ෂාකාරී වීම.
(7) විනෝද චාරිකා සංවිධානය.
(8) සේවය අගය කිරීම හා ප්‍රශංසා කිරීම.
(9) තීරණ ගැනීමට සම්බන්ධ කර ගැනීම.

**(ලකුණු ½ × 4 = ලකුණු 02)**

(iv) (අ) ආයතනයක, අවිධිමත් සන්නිවේදනයේ වාසි දෙකක් හා අවාසි **දෙකක්** සඳහන් කරන්න.

වාසි - 1. ලබා ගැනීමට අපහසු සමහර තොරතුරු ලබාගත හැකි වීම.
2. වැඩි පිරිවැයක් නොදරා තොරතුරු සන්නිවේදනය වීම.
3. වැඩි පිරිසකට ඉක්මනින් තොරතුරු සන්නිවේදනය වීම.
4. විධිමත් සන්නිවේදනයකට වඩා විශ්වාසවීම හා ග්‍රහණය වීම.
5. පුද්ගල සම්බන්ධතා ශක්තිමත් වීම.

**(වාසි දෙකකට ලකුණු ½ × 2 = ලකුණු 01)**

අවාසි - 1. අසත්‍ය තොරතුරු සන්නිවේදනය විය හැකි වීම.
2. විනය ගැටළු ඇති වීම.
3. ප්‍රතිරූපයට හානි සිදුවිය හැකි වීම.
4. පාලනය කළ නොහැකි වීම.
5. තොරතුරු විකෘති විය හැකිවීම.

**(අවාසි දෙකකට ලකුණු ½ × 2 = ලකුණු 01)**

(ආ) සංවිධාන ධූරාවලියේ ඉහළ කළමනාකරණයේ සිට පහළ කළමනාකරණය දක්වාත්, පහළ කළමනාකරණයේ සිට ඉහළ කළමනාකරණය දක්වාත් සන්නිවේදනය කෙරෙන තොරතුරු වර්ග **දෙක** බැගින් ලියන්න.

ඉහළ සිට පහළට

(1) කළමනාකරණ තීරණ
(2) කළමනාකරණ සැලසුම්
(3) බලතල පැවරීම පිළිබඳව
(4) වැඩ බෙදීම පිළිබඳව
(5) අංශ අතර සමායෝජනය
(6) ප්‍රශංසා හා අගය කිරීම **(ලකුණු ½ × 2 = ලකුණු 01)**

පහළට සිට ඉහළට

(1) වගවීම සම්බන්ධ කරුණු
(2) සේවක දුක් ගැනවිලි
(3) සේවක ගැටළු
(4) රැකියාව පිළිබඳ ගැටළු
(5) සේවක යෝජනා **(ලකුණු ½ × 2 = ලකුණු 01)**

(v) ගොඩනැගිලි ඉදිකරන්නකු වූ කමල්, කලින් කළ ඉදිකිරීම් ව්‍යාපෘතිවලදී ගොඩනැගිලි ද්‍රව්‍ය අපතේ ගිය බවත්, නියමිත වේලාවට ව්‍යාපෘති නිම කිරීමට නොහැකි වූ බවත් හඳුනාගෙන ඇත. ඉදිරි ව්‍යාපෘතිවලදී ද්‍රව්‍ය අපතේයාම අඩුකර ගැනීමට හා නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමට කමල්ට අනුගමනය කළ හැකි පාලන ක්‍රම **දෙක** බැගින් සඳහන් කරන්න.

අපතය අඩු කර ගැනීමට

(1) තොග පාලන ක්‍රම පවත්වාගෙන යාම.
(2) ගුණත්ව ප්‍රමිති අනුගමනය කිරීම.
(3) තත්ත්ව පාලන ක්‍රම අනුගමනය කිරීම.
(4) සේවක අධීක්ෂණ ක්‍රම අනුගමනය කිරීම.
(5) සේවක දැනුවත් කිරීම.

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

නියමිත වේලාවට ව්‍යාපෘති නිමකිරීමට

(1) කාලසටහන් සකස් කිරීම.
(2) නියමිත කාලයට අදාළ ක්‍රියාකාරකම් නිමකර තිබේදැයි නියාමනය කිරීම.
(3) විචලනයන් ඒ අවස්ථාවේදීම නිවැරදි කිරීම.
(4) සේවක දැනුවත් කිරීම.
(5) නවීන ශිල්ප ක්‍රම භාවිතය.

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

## 6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**6 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




6 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 58%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 09%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 38%කි.

**6 ප්‍රශ්නයේ කොටස් හා අනුකොටස්වල පහසුතාව**




6 ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්

මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 07 අතුරෙන් පහසුතාවය වැඩිම කොටස වන්නේ (iii) (ආ) වන අතර එහි පහසුතාව 68%කි. එසේම පහසුතාවය අඩුම කොටස (v) කොටස වන අතර එහි පහසුතාවය 24%කි. සෙසු කොටස් වල පහසුතාවය ප්‍රස්තාරයෙන් දැක්වේ.

හයවන ප්‍රශ්නයෙහි (iii) කොටසෙහි පහසුතාව 39%කි. එම ප්‍රශ්නය අඩු පහසුතාවයක් පෙන්වීමට හේතුව වූයේ කළමනාකරුවකුට බලය ලැබෙන ප්‍රධාන මූලාශ්‍ර පිළිබඳව නිසි අවබෝධයකින් තොරව පිළිතුරු සපයා තිබීමයි. ඒ අනුව බලය ලැබෙන මූලාශ්‍ර පිළිබඳව අවබෝධයක් ලැබෙන අයුරින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වඩාත් සුදුසුය.

හයවන ප්‍රශ්නයෙහි (iv) (ආ) අනුකොටසෙහි පහසුතාව 39%කි. එවැනි අඩු මට්ටමක් පැවතීමට හේතුව වූයේ කළමනාකරණ ධූරාවලිය තුළ සන්නිවේදනය කෙරෙන තොරතුරු පිළිබඳව හොඳ අවබෝධයක් නොතිබීමයි. ඕනෑම ආයතනයක ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් සන්නිවේදනය වන තොරතුරු ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් තහවුරු කිරීම යෝග්‍ය වේ.

හයවන ප්‍රශ්නයෙහි (v) කොටසෙහි පහසුතාව 24%කි. එවැනි ඉතා පහළ මට්ටමක් ඇති වීමට හේතුව වූයේ කෙටි සිද්ධි ආශ්‍රිතව පිළිතුරු ලිවීමට අපේක්ෂයන්ට අවබෝධයක් නොමැති වීමයි. නිර්මාණශීලී චින්තනය තහවුරු වන ආකාරයට සිද්ධි අධ්‍යයනය ආශ්‍රිත විෂයානුබද්ධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් සාර්ථක පිළිතුරු වෙත යොමු විය හැකිය.

## 7 ප්‍රශ්නය

(i) නිෂ්පාදිතයක මට්ටම් පහ අතරෙන් ඕනෑම මට්ටම් හතරක්, ජංගම දුරකථන නිදසුනක් ලෙස ගෙන විස්තර කරන්න.

(1) හර ප්‍රතිලාභ (මූලික ප්‍රතිලාභ) - ඇමතුම් දීම හා ලබා ගැනීම.
(2) මූලික නිෂ්පාදිතය - යතුරු පුවරුව හා පැහැදිලි ශබ්දය
(3) අපේක්ෂිත නිෂ්පාදිතය - බ්ලූටූත්, කැමරා, වර්ණය, ප්‍රමාණය
(4) වැඩි දියුණු කළ නිෂ්පාදිතය - තාක්ෂණික උපාංග හා පහසුකම් එකතු කිරීම.
(5) විභව නිෂ්පාදිතය - නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කර තිබිය හැකිය.

**(මට්ටම් දැක්වීමට ලකුණු ½ × 4 = ලකුණු 02)**
**(විස්තර කිරීමට ලකුණු ½ × 2 = ලකුණු 02)**

(ii) (අ) ඇසුරුමක් නිර්මාණය කිරීමේ දී එහි යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා යොදා ගත හැකි පරීක්ෂණ (ක්ෂේත්‍ර) **හතරක්** සඳහන් කරන්න.

(1) තාක්ෂණික යෝග්‍යතාව පිළිබඳව.
(2) වර්ණය හා කියවීමේ හැකියාව පිළිබඳව.
(3) නිෂ්පාදිතයේ ස්වභාවය පිළිබඳව.
(4) ශක්තිමත් බව.
(5) කල්පැවැත්ම පිළිබඳව.
(6) පරිසරයට ඔරොත්තු දෙන බව පිළිබඳව.
(7) ප්‍රවාහන හැකියාව පිළිබඳව
(8) රසායනික ප්‍රතික්‍රියා පිළිබඳව.
(9) සිල්ලර අලෙවිකරුවන් හා පාරිභෝගික ආකල්ප

**(ලකුණු ½ × 4 = ලකුණු 02)**

(ආ) සඵලදායි හුවමාරුවක් සිදුවීමට සපුරාගත යුතු කොන්දේසි **හතරක්** ලැයිස්තුගත කරන්න.

(1) අවම වශයෙන් දෙපාර්ශ්වයක් සිටිය යුතු වීම.
(2) එක් එක් පාර්ශ්ව සතුව අනෙක් පාර්ශ්වයට වටිනාකමක් ඇති යමක් තිබිය යුතු වීම.
(3) එක් එක් පාර්ශ්ව අතර අදහස් හුවමාරුවට හා බෙදා හැරීමට හැකියාව තිබිය යුතු වීම.
(4) එකිනෙක පාර්ශ්වයන්ට යමක් පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට නිදහස තිබිය යුතු වීම.
(5) එක් එක් පාර්ශ්වය විසින් අනෙකුත් පාර්ශ්වය සමඟ ගනුදෙනු කිරීම යෝග්‍ය යැයි විශ්වාස කළ යුතු වීම.

**(ලකුණු ½ × 4 = ලකුණු 02)**

(iii) (අ) "පාන්" සහ "ඇස් කණ්ණාඩි" යන භාණ්ඩ වර්ග නිෂ්පාදනය කිරීමට වඩාත් යෝග්‍ය නිෂ්පාදන ක්‍රම (Production methods) සඳහන් කර, ඊට හේතු දක්වන්න.

පාන් - කාණ්ඩ නිෂ්පාදනය/ ප්‍රවාහ නිෂ්පාදනය
ඇස් කණ්ණාඩි - කාර්ය නිෂ්පාදනය/ ඇණවුමට නිෂ්පාදනය

**(ක්‍රම 2 දැක්වීමට ලකුණු ½ × 2 = ලකුණු 01)**
**(හේතු දැක්වීමට ලකුණු ½ × 2 = ලකුණු 01)**

(ආ) නිෂ්පාදන කර්මාන්ත ආයතනයක නිෂ්පාදන පිරියත නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු **හතරක්** ලියන්න.

(1) නිෂ්පාදන ක්‍රියාවලියේ ස්වභාවය.
(2) යන්ත්‍රවල නම්‍යශීලී භාවිතය.
(3) නිෂ්පාදන ශිල්පීය ක්‍රමය.
(4) ගනුදෙනුකරුවන් හා සේවකයන්ට අවශ්‍ය වන ඉඩකඩ.
(5) ගනුදෙනුකරුවන් නිෂ්පාදන ක්‍රියාවලියට බද්ධවීමේ තරම.
(6) ආකර්ශණීය බව.
(7) අධීක්ෂණය කිරීමේ පහසුව. **(ලකුණු ½ × 4 = ලකුණු 02)**

(iv) පසුගිය වසර කිහිපය තුළ ආයතනයක මෙහෙයුම් ආදායමෙන් අඩු වන තත්ත්වයක් පෙන්වයි.

(1) නිෂ්පාදන විවිධාංගීකරණය.
(2) නිෂ්පාදිතය වැඩි දියුණු කිරීම/ ඵලදායී බව වැඩි කිරීම.
(3) ප්‍රචාරණ හා ප්‍රවර්ධන ක්‍රියාමාර්ග වෙනස් කිරීම.
(4) මහජන සම්බන්ධතා වැඩි දියුණු කිරීම.
(5) සෘජු අලෙවිකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.
(6) පිරිවැය අඩු කිරීමේ ක්‍රම භාවිත කිරීම.
(7) අපතේ යාම් අවම කිරීම සඳහා ක්‍රම අනුගමනය කිරීම.

**(ලකුණු 1 × 4 = ලකුණු 04)**

(v) සීමා සහිත පොදු සමාගමක බාහිර අරමුදල් සම්පාදන මාර්ග දෙකක් නම් කර, ඒවායෙහි වාසි හා අවාසි **දෙක** බැගින් සඳහන් කරන්න.

(1) කොටස් නිකුතුව
(2) ණයකර නිකුතුව
(3) බැංකු ණය
(4) කල්බදු
(5) වාණිජ පත්‍රිකා

**(මාර්ග දැක්වීමට ලකුණු 1 × 2 = ලකුණු 02)**
**(වාසි දැක්වීමට ලකුණු ½ × 2 = ලකුණු 01)**
**(අවාසි දැක්වීමට ලකුණු ½ × 2 = ලකුණු 01)**

## 7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**7 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




7 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 48%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ. II කොටසින් අඩුම අපේක්ෂකයන් සංඛ්‍යාවක් තෝරා ගෙන ඇත්තේ මෙම ප්‍රශ්නයයි.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 13%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 47%ක් වේ.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් හා අනුකොටස් 07 අතුරෙන් පහසුතාවය වැඩිම කොටස (iii) (අ) වන අතර එහි පහසුතාව 69%කි. එසේම පහසුතාවය අඩුම කොටස (iii) (ආ) වන අතර එහි පහසුතාව 27%කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාවය ප්‍රස්තාරයෙහි දැක්වේ.

හත්වන ප්‍රශ්නයෙහි (ii) (අ) අනුකොටසෙහි පහසුතාව 31%කි. මෙසේ පහසුතාවය අඩුවීමට හේතුව ඇසුරුමක් නිර්මාණය කිරීමේ දී එහි යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට යොදා ගත හැකි පරීක්ෂණ පිළිබඳව අපේක්ෂකයින් තුළ නිසි අවබෝධයක් නොතිබීමය. නිෂ්පාදිත සඳහා විවිධ ඇසුරුම් නිර්මාණය කරනු ලබන අතර එසේ ඇසුරුමක් නිර්මාණය කිරීමේ දී එහි යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා යොදා ගනු ලබන පරීක්ෂණ ක්ෂේත්‍ර ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය තහවුරු කිරීමට ප්‍රායෝගික ක්‍රියාකාරකම් සංවිධානය විය යුතු ය.

හත්වන ප්‍රශ්නයෙහි (iii) (ආ) අනුකොටසෙහි පහසුතාව 27%කි. එවැනි පහළ මට්ටමේ පහසුතාවයන් ඇතිවීමට හේතුව වූයේ නිෂ්පාදන පිරියත නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු කෙරෙහි නිශ්චිත අවබෝධයක් නොමැති වීමයි. එම නිසා කම්හලක නිෂ්පාදන පිරියත නිර්මාණය කිරීමේ දී සලකා බලන ක්ෂේත්‍ර පිළිබඳව, ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා තුළින් නිරීක්ෂණය කිරීමට අපේක්ෂකයින්ට අවස්ථාව සලසා දීම තුළින් ප්‍රායෝගික දැනුම ලබා දිය හැකි ය.

හත්වන ප්‍රශ්නයෙහි (iv) කොටසෙහි පහසුතාව 40%කි. එයට හේතුව ආයතනයක මෙහෙයුම් ආදායම වැඩිකර ගැනීමට භාවිත කළ හැකි උපාය මාර්ග පිළිබඳව අපේක්ෂකයින් තුළ අවබෝධයක් නොතිබීමය. මේ පිළිබඳව පන්ති කාමරය තුළ දී අභ්‍යාස කිරීමෙන් අපේක්ෂකයින්හට නිශ්චිත අවබෝධයක් ලබා දිය හැකි ය.

**8** ප්‍රශ්නය

(i) ලිපිකරුවන් බඳවා ගැනීම සඳහා අන්තර්ජාලය හරහා අයදුම්පත් කැඳවීම තුළින් ආයතනයකට ඇති විය හැකි වාසි දෙකක් සහ අවාසි දෙකක් සඳහන් කරන්න.

වාසි

(1) පිරිවැය අඩු වීම.
(2) වේගවත් ක්‍රමයක් වීම.
(3) වාර්තා සකස් කිරීම පහසුවීම.
(4) ගබඩා කර තබා ගැනීම පහසුවීම.
(5) අයදුම්පත් විශාල සංඛ්‍යාවක් ලබා ගත හැකි වීම.
(6) සන්සන්දනය කිරීම පහසු වීම.
(7) යෝග්‍ය අයදුම්කරුවන් හඳුනා ගැනීම පහසුවීම.

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

අවාසි

(1) අනවශ්‍ය ලෙස අයදුම්පත් විශාල ප්‍රමාණයක් ලැබීම.
(2) අයදුම්කරුවන්ගේ සමහර හැකියාවන් (අත් අකුරු වැනි) මැනිය නොහැකි වීම.
(3) සමහර සුදුසු පුද්ගලයින්ට අයදුම්පත් ඉදිරිපත් කළ නොහැකි වීම.
(4) තාක්ෂණික දෝෂ ඇතිවිය හැකි වීම.

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

(ii) මාස හයක පරිවාස කාලයකට යටත්ව මීට මාස පහකට පෙර නිමාලි, කළමනාකරණ සහකාරවරියක වශයෙන් ABC ආයතනයට බැඳුනා ය. ඇයගේ වැඩවල ගුණත්වය පිළිබඳ කළමනාකරණය සෑහීමකට පත් වී නොමැති නිසා නිමාලි පිළිබඳව කළමනාකරණයට ගත හැකි තීරණ සඳහන් කරන්න.

(1) පරිවාස කාලය දීර්ඝ කිරීම.
(2) වාචිකව අවවාද කිරීම.
(3) ලිඛිතව අවවාද කිරීම.
(4) පුහුණුව සඳහා යොමු කිරීම.
(5) වෙනත් අංශයකට මාරු කිරීම
(6) සේවයෙන් ඉවත් කිරීම. **(ලකුණු 1 × 4 = ලකුණු 04)**

(iii) (අ) තොරතුරු පද්ධතිය ආරක්ෂා කර ගැනීම සඳහා ව්‍යාපාරයකට භාවිත කළ හැකි ආරක්ෂිත ක්‍රම **හතරක්** දක්වන්න.

(1) අනුමත පුද්ගලයින්ට පමණක් පද්ධතියට ඇතුල්වීමට අවසර දීම.
(2) Pass word (මුර පද) භාවිත කිරීම.
(3) Fire walls (ගිනි පවුර) යොදා ගැනීම.
(4) Anti Virus (ප්‍රති වෛරස්) යොදා ගැනීම.
(5) Backup (උපස්ථ) යොදා ගැනීම.
(6) ප්‍රතිපත්ති හා උපදෙස් සැකසීම.
(7) පුහුණු කිරීම. **(ලකුණු ½ × 4 = ලකුණු 02)**

(ආ) දත්ත හා තොරතුරු සන්සන්දනය කරමින්, ඒවා අතර පවතින වෙනස්කම් **දෙකක්** ලියන්න.

| දත්ත | තොරතුරු |
|---|---|
| 1. සැකසුම් ක්‍රියාවලියට ආදානය කරන මූලික දැ වේ. | දත්ත සැකසීමේ ක්‍රියාවලියෙන් බිහිවන ප්‍රතිදානයයි. |
| 2. තීරණ ගැනීමට සෘජුවම භාවිත කළ නොහැකිය. | තීරණ ගැනීමට භාවිත කළ හැකිය. |
| 3. දත්ත වශයෙන් පවතින තෙක් වටිනාකමක් ගෙන නොදේ. | වටිනාකමක් ඇත. |
| 4. අමුද්‍රව්‍යයකි. | නිමිද්‍රව්‍යයකි. |

**(වෙනස්කම් ලකුණු 1 × 2 = ලකුණු 02)**

(iv) ආයතනයක මෙහෙයුම් මට්ටමේ දී ගනුදෙනු සැකසුම් පද්ධති (TPS) භාවිත කළ හැකි කළමනාකරණ ශ්‍රිත දෙකක් නම් කර, ඒවාට අයත් ගනුදෙනු සැකසුම් පද්ධති **දෙක** බැගින් සඳහන් කරන්න.

(1) නිෂ්පාදන අංශය - ද්‍රව්‍ය ඇණවුම් කිරීමට
ද්‍රව්‍ය මිල දී ගැනීමට

(2) අලෙවිකරණ අංශය - විකුණුම් ඇනවුම් ලබා ගැනීම
මිල කිරීමට

(3) මූල්‍ය ගිණුම් අංශය - අයවැය ලේඛන සැකසීමට
පොදු ලෙජරය පිළියෙල කිරීමට
මුදල් ගෙවීම් කිරීමට

(4) මානව සම්පත් අංශය - සේවක පැමිණීම් වාර්ථා කිරීමට
වැටුප් වාර්තා සකස් කිරීමට
පුහුණු හා සංවර්ධනය

**(ශ්‍රිත නම් කිරීමට ලකුණු 1 × 2 = ලකුණු 02)**
**(පද්ධතිය දැක්වීමට ලකුණු ½ × 4 = ලකුණු 02)**

(v) (අ) ව්‍යාපාර සැලැස්මක් වැදගත් වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(1) ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා මග පෙන්වීමට.
(2) නිෂ්පාදන කාර්යයේ දී ඇතිවන අපතේ යාම්, ප්‍රමාද වීම් අවම කරගත හැකිවීම.
(3) ව්‍යාපාරයට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමට.

**(ලකුණු 1 × 2 = ලකුණු 02)**

(ආ) ව්‍යාපාර සැලැස්මක අංගයක් ලෙස මෙහෙයුම් සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතා **හතරක්** සඳහන් කරන්න.

(1) ඉදිරි මෙහෙයුම් කටයුතු පිළිබඳව කල්තබා අවබෝධයක් ලබාගත හැකිවීම.
(2) නිෂ්පාදන කාර්යයේ දී ඇතිවන අපතේ යාම්, ප්‍රමාද වීම් අවම කරගත හැකිවීම.
(3) නිෂ්පාදිතයේ ගුණත්වය ඉහළ නංවා ගතහැකි වීම.
(4) නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යා හැකි වීම.
(5) කටයුතුවලට අදාළ සම්පත් ප්‍රතිපාදනයට. **(ලකුණු ½ × 4 = ලකුණු 02)**

**8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා**




8 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 67%කි. (ප්‍රස්තාරය 2) මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 15%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 44%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 10%ක් ද,

ලෙස ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 41%කි.




මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 07 අතුරෙන් පහසුතාවය වැඩිම කොටස I වන අතර එහි පහසුතාව 66%කි. එසේම පහසුතාවය අඩුම කොටස IV වන කොටස අතර එහි පහසුතාව 19%කි. සෙසු ප්‍රශ්න කොටස්වල පහසුතාවයන් ද ප්‍රස්තාරයෙහි දැක්වේ.

අටවන ප්‍රශ්නයෙහි (iii) (අ) අනුකොටසෙහි පහසුතාව 42%කි. මෙවැනි පහසුතාවයක් ඇතිවීමට හේතුව තොරතුරු පද්ධති ආරක්ෂා කර ගැනීමට ව්‍යාපාරයකට භාවිත කළ හැකි ආරක්ෂිත ක්‍රම පිළිබඳව ප්‍රායෝගික භාවිතයන් ගැන අවබෝධයක් නොමැති වීමයි. මේ සඳහා තොරතුරු පද්ධති ආරක්ෂා කිරීමට ඇති නවතම ආරක්ෂිත ක්‍රම පිළිබඳව අවබෝධය ලැබෙන පරිදි විවිධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාසලේ පරිගණක විද්‍යාගාර තුළ දී සිදුකළ යුතු වේ. එමගින් අපේක්ෂකයින් ගේ දැනුම හා අවබෝධය යාවත්කාලීන කරගත හැකි වේ.

අටවන ප්‍රශ්නයෙහි (iv) කොටසෙහි පහසුතාව 19%කි. මෙවැනි අඩු තත්වයක් පෙන්නුම් කිරීමට හේතු වී ඇත්තේ මෙහෙයුම් මට්ටම් වලදී ගනුදෙනු සැකසුම් පද්ධති භාවිත කළ හැකි කළමනාකරණ ශ්‍රිතයන් සම්බන්ධ කරගත් ගැටළු වලට පිළිතුරු සැපයීමට අපොහොසත් වීමයි. ඒ ඒ කළමනාකරණ ශ්‍රිත වලදී ගනුදෙනු සැකසුම් පද්ධති වලට පැවරෙන ශ්‍රිතයන් පිළිබඳ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට ඇතුළත් වන සේ පාඩම් සංවිධානය කර ගැනීම වඩාත් සුදුසු වේ.

අටවන ප්‍රශ්නයෙහි (v) (ආ) අනුකොටසෙහි පහසුතාව 32%කි. මෙවැනි පහළ පහසුතා මට්ටමක් ලබා ගැනීමට හේතු වී ඇත්තේ ව්‍යාපාර සැලැස්මක අන්තර්ගතයන් හා එම අන්තර්ගතයන් සකස් කිරීමේ අවශ්‍යතා පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් අපේක්ෂකයන් තුළ නොමැති වීමයි. එම නිසා ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත කරුණු හඳුන්වා දී පන්ති කාමරය තුළ දී ප්‍රායෝගිකව ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමට අපේක්ෂකයන්ට මඟපෙන්විය යුතු ය.

**2.2.3** II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක 01, 02, 03 හා 04 යන ප්‍රශ්න I වන කොටසට අයත් වේ. ප්‍රශ්න 05, 06, 07 හා 08 යන ප්‍රශ්න II කොටසට අයත් වේ. එම කොටස් දෙකෙන් අවම වශයෙන් එක කොටසකින් ප්‍රශ්න දෙකක් බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු වේ.

I කොටසේ 56%ක් වූ ඉහළම පහසුතාවක් දැකිය හැක්කේ තුන්වන ප්‍රශ්නයට වන අතර, අඩුම පහසුතාව වූ 45% දැකිය හැක්කේ හතරවන ප්‍රශ්නයට ය.

II කොටසේ 50%ක් වූ ඉහළම පහසුතාව හත්වන ප්‍රශ්නය සඳහාත්, අඩුම පහසුතාව වූ 43% හයවන ප්‍රශ්නය සඳහාත් දැකිය හැකි ය.

I වන හා II වන කොටස්වල සමස්ත පහසුතාව විමසා බැලීමේ දී I කොටසේ සමස්ත සාමාන්‍ය පහසුතාව 51%කි. එමෙන්ම II කොටසේ සමස්ත සාමාන්‍ය පහසුතාව 47%කි.

## III කොටස

**3 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :**

**3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :**

**පොදු උපදෙස් :**

- ★ ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය වේ ද, කොපමණ ලකුණු ලැබේ ද, කොපමණ කාලයක් ලැබේ ද, යන කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර, ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ප්‍රශ්න පිළිබඳව නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන පිළිතුරු ලිවිය යුතුය.

- ★ I පත්‍රයේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය දෙකයි.

- ★ II පත්‍රයේ I හා II උප කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරාගෙන මුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. කාලය පැය තුනයි.

- ★ සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

- ★ අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

- ★ ප්‍රශ්න අංක හා අනුකොටස් අංක නිවැරදිව සඳහන් කළ යුතුය.

- ★ සියලුම ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ලිවිය යුතුය. ප්‍රශ්න යටතේ දී ඇති තොරතුරුත්, ලබා ගත යුතු පිළිතුරු හෝ සාධනය කළ යුතු ප්‍රතිඵල කවරේ ද යන්නත් පැහැදිලිව අවබෝධ කර ගත යුතුය.

- ★ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී, දී ඇති කාලය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතුය.

- ★ පැහැදිලි අත් අකුරින් පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු ලිවීමේදී නිල් පාට හෝ කළු පාට පෑන් පමණක් භාවිත කළ යුතුය. අනෙකුත් පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.

- ★ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීමද නොකළ යුතුය.

**විශේෂ උපදෙස් :**

* ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා බහුවරණ ප්‍රශ්න සඳහා නියමිත ස්ථානයේ නිවැරදි වරණයේ අංකය පෑනකින් සටහන් කළ යුතු යි.

* ප්‍රශ්න අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ හිස්තැනෙහි සුදුසු වචන ලියා හිස්තැන් පිරවිය යුතු යි.

* ප්‍රශ්න අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු අදාළ ස්ථානයේ ලිවීම කළ යුතු යි.

* ඒ ඒ ප්‍රශ්නය යටතේ ප්‍රශ්න අනු කොටස් සියල්ලටම නිවැරදි ඉලක්ක ගත පිළිතුරු ලිවිය යුතු ය.

* තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව අදාළ කරුණු ඉදිරිපත් කළ යුතු ය.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා

* ව්‍යාපාර අධ්‍යයනය විෂයයේ ස්වභාවය පිළිබඳ ව ගුරුවරයා ගැඹුරු හා පුළුල් අවබෝධයකින් ද යාවත්කාලීන වූ දැනුමකින් ද යුතුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට ප්‍රවේශ විය යුතුය. ව්‍යාපාර අධ්‍යයනය දිනෙන් දින වෙනස් වන විෂයය කරුණු රාශියකින් යුක්ත වේ. එමනිසා එම වෙනස්වීම් පිළිබඳ ව දැනුවත් වීමට ගුරුවරයා සමත් විය යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂයය න්‍යායාත්මක දැනුමෙන් ඔබ්බට විහිදෙන විෂයයකි. එම නිසා එම විෂයයට ආදරය කිරීමටත්, එම විෂයය ක්ෂේත්‍රය තුළ ජීවත් වීමටත් (Love & Live ) ගුරුවරයා සමත් විය යුතු අතර ඒ සඳහා අපේක්ෂකයින්ට මග පෙන්වීමක් ද කළ යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂයය උගන්වන ගුරුවරයා පන්ති කාමරය තුළ සිදුවන සාමාන්‍ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අමතරව කණ්ඩායම් ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර චාරිකා, ව්‍යාපෘති, ප්‍රදර්ශන, ඉදිරිපත් කිරීම් වැනි ක්‍රියාකාරකම්වලින් සමන්විත විවිධ ක්‍රමවේද විෂයය පිළිබඳ ව දැනුවත් කිරීම සඳහා භාවිත කළ යුතුය. විෂයය තුළ පවතින සංකල්ප තහවුරු කිරීමට හැකි සෑම අවස්ථාවකදී ම සිද්ධි අධ්‍යයනයන් යොදා ගත යුතුය. මෙම ක්‍රියාකාරකම්වලදී අපේක්ෂකයින්ගේ උපරිම සහභාගිත්වය සඳහා ඉඩ සැලසෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතුය. ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් විෂය කොටස් අවබෝධයට හා භාවිතයට අපේක්ෂකයින්ට ඉඩ ප්‍රස්ථා ලබා දිය යුතුය.

* නූතන ව්‍යාපාර ලෝකයේ ව්‍යාපාර කටයුතු අන්තර්ජාලය වැනි නූතන තාක්ෂණය හරහා සිදු වන බැවින් විෂයය දැනුම තහවුරු කිරීමේදී පහසුකම් අනුව වීඩියෝ දර්ශන, පරිගණක මෘදුකාංග, අන්තර්ජාල භාවිතය වැනි අවස්ථාද බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර සුහුරු පන්ති කාමර (Smart Class Room) වැනි නවීන තාක්ෂණික ක්‍රමවේද භාවිත කිරීම වඩා සුදුසුය.

* විෂයය අවබෝධය හා දැනුම යාවත්කාලීන කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව සහ අනෙකුත් ප්‍රකාශන, වාර්ෂික අයවැය යෝජනා, විෂය කරුණුවලට අදාළ අණ පනත්, නියෝග, නීතිරීති, ආයතනික පහසුකම් සපයන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වැනි සංවිධානවල නිල ප්‍රකාශන පරිශීලනය කළ යුතුය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශයේ අභිමතාර්ථ පරීක්ෂා කිරීමේදී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් ඉටුකර ගත යුතු සුවිශේෂී අභිමතාර්ථ පද්ධතියක් ඇත. එම අභිමතාර්ථ ප්‍රධාන වශයෙන් එදිනෙදා ජීවිතයට අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප ලබාදෙන පරිදි සකස් කර ඇත. මීට අමතරව අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනැගෙන ජීවන පුරුදු බවට ඉගෙනුම් ඵලය සකස් විය යුතුය. එම අභිමතාර්ථ සාක්ෂාත් කරගත හැකිවන පරිදි ව්‍යාපාර අධ්‍යයනය විෂය ඉගැන්වීමේදී විවිධ ක්‍රම අනුගමනය කිරීමට ගුරුවරයා සැලකිලිමත් විය යුතුය. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මගින් පෙන්වා දෙන මගපෙන්වීම් ඔස්සේ ගුරුභවතා විසින් උචිත ක්‍රමවේද භාවිත කිරීම සාර්ථක ඉගෙනුම් - ඉගැන්වීම් වැඩ පිළිවෙළකට හේතුවනු ඇත.

* ගුරුවරයා තම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරදී අපේක්ෂකයින් ඇගයීමට ලක්කළ යුතුය. පන්ති කාමරය තුළ අපේක්ෂකයින් ඉගෙනීමෙහි යෙදී සිටින අතරතුරදී ගුරුවරයාට ඔවුන්ගේ ඉගෙනුම් හැකියා, නොහැකියා හා ප්‍රවීණතා පිළිබඳ ව අවබෝධ කරගැනීමට එමගින් හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුරදීම අපේක්ෂකයින්ගේ දුර්වලතා හඳුනා ගෙන ඒ සඳහා ප්‍රතිපෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගත යුතුය.

* ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අඩංගු අභ්‍යාස කිරීමට අපේක්ෂකයින්ගේ අවධානය යොමුවන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමට උනන්දු විය යුතුය.

* ප්‍රශ්නයේ සඳහන් වන නිර්වචනය, අර්ථකථනය යන පද එකිනෙකට වෙනස් බව පෙන්වා දිය යුතුය. එමෙන්ම විමසන්න, පැහැදිලි කරන්න, විස්තර කරන්න, හඳුන්වන්න යන පද එකිනෙකට වෙනස් අර්ථ දක්වන බව අපේක්ෂකයින්ට අවබෝධ කර දෙමින් එකිනෙකට වෙනස් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ඔවුන් යොමු කරවිය යුතුය.

* ගුරුවරයා තමන්ගේ දැනුම භාවිත කරමින් කුඩා සිද්ධි අධ්‍යයන නිර්මාණය කර ඒ සඳහා න්‍යායාත්මක දැනුම යොදා ගන්නා ආකාරය අපේක්ෂකයින් සමඟ සාකච්ඡා කිරීම තුළින් එවැනි ප්‍රශ්න සඳහා ඔවුන් සූදානම් කළ හැකිය.

* ව්‍යාපාර අධ්‍යයනය විෂයේ II ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විතය. මෙහි I වන කොටස 12 වන ශ්‍රේණියටත් II වන කොටස 13 වන ශ්‍රේණියටත් අදාළ වේ. සමස්ත ඇගයීම් දෙස බලන විට පෙනී යන්නේ I වන කොටස සඳහා වැඩිපුර ලකුණු ලබා ගෙන ඇති තත්ත්වයක් වන අතර II වන කොටස සඳහා අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ඇති තත්ත්වයකි. එම නිසා 13 වන ශ්‍රේණියට අදාළ පාඩම් ඒකක කෙරෙහි ද වැඩි අවධානයක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොමු කළ යුතුය. ඒ සමඟම II වන කොටසේ ප්‍රශ්නවලට අපේක්ෂකයින් වැඩියෙන් පුරුදු පුහුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව වටහාගත යුතුව ඇත.

* බ්ලුම්ගේ වර්ගීකරණයට අනුව දැනුම, අවබෝධය, භාවිතය, විග්‍රහය, ඇගයීම හා නිර්මාණය යන ඉගෙනුම් මට්ටම් II ප්‍රශ්න පත්‍රයේ සාධන තත්වයන් සමඟ සැසඳීමේ දී එතරම් සාර්ථකත්වයක් දැකිය නොහැකිය. එහි නිර්මාණය හා ඇගයීම යන ඉගෙනුම් මට්ටම් ඉතා අඩු ප්‍රතිශතයක ද දැනුම, අවබෝධය, භාවිතය හා විග්‍රහය සඳහා මධ්‍යස්ථ ප්‍රතිශත තත්වයක් ද පෙන්වන අතර ඉතා හොඳ සාධනීය තත්වයක් කිසිම මට්ටමක දී දක්නට නොලැබුණි. එම නිසා දැනුම, අවබෝධය, භාවිතය, විග්‍රහය, ඇගයීම හා නිර්මාණය යන සියළුම නිපුණතාවන් අපේක්ෂකයන්ට ලැබෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතු වේ.

* අ.පො.ස. (උ.පෙළ) ව්‍යාපාර අධ්‍යයනය ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සපයා ඇති ආකාරය දෙස බලන විට ව්‍යාපාර අධ්‍යයනය විෂයය හා සම්බන්ධ සංකල්ප, පාරිභාෂික පද, නව ප්‍රවණතා පිළිබඳ ව අපේක්ෂකයින් තුළ ඇති දැනුම ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. එමෙන්ම පිළිතුරු නිවැරදි ව ගළපා පැහැදිලි ව ඉදිරිපත් කිරීමට අපේක්ෂකයින් නිපුණතාව ලබා නොමැති බවද පෙනී යන තවත් කරුණකි. එම නිසා එම කරුණු කෙරෙහි පන්ති කාමර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී අවධානය යොමු කළ යුතුය.